# නායයෑම් ආපදා අවමකරණය තුළින් නායයෑම්වලට ගොදුරු වීමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

## ආපදා අවදානම් ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම

ආපදා අවදානම් ස්ථානීය අංක-76 – L2

ඇල්ල-වැල්ලවාය පාර (25/1 බෝක්කුව අසල)

බදුල්ල දිස්ත්‍රික්කය

**මාර්තු 2022**

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර, කොළඹ 05
දු:ක: 011 2588946/011 2503826/ 011 2503431

# පටුන


*1. හැඳින්වීම* *6*

1.1 ව්‍යාපෘති සාරාංශය 6

1.2 අපේක්ෂිත පරිශීලකයින් 6

*2. ව්‍යාපෘතියේ සහ ස්ථානයේ විස්තරය* *7*

2.1. යෝජිත ආපදා අවදානම් අවමකරණ ස්ථානයේ නම 7

2.2. ස්ථානයේ විස්තරය 7

2.3 භූ විද්‍යාත්මක ස්වභාවය හා ඉඩම් හිමිකාරිත්වය 8

*3. නායයෑම් ආපදා සිදුවීම් පිළිබඳ තොරතුරු* *10*

3.1 පෙර වාර්තා වන ලද සිදුවීම් 10

3.2. නායයෑමේ බලපෑම් සහ ප්‍රතිවිපාක 11

3.3. නායයෑම් ආපදා අවදානම අවමකිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග 11

3.4. පදිංචිකරුවන් මෙම ස්ථානයෙන් ඉවත් කිරීම 12

3.5. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය (ප්‍රගතිය) 12

*4. බෑවුම් අස්ථායී වීම සිදුව ඇති ප්‍රදේශය හා ආසන්න ප්‍රදේශය පිළිබඳ විස්තරය සහ වර්තමාන අවදානම් මට්ටම* *14*

4.1. බෑවුම් අස්ථායී ප්‍රදේශය ආශ්‍රිත පරිසරය 14

4.2. වර්තමාන අවදානම් මට්ටම 14

*5. ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත අවදානම් අවමකරණ ක්‍රම* *14*

*6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් සිදුවිය හැකි සංරචකයන්* *14*

*7. සිදුවිය හැකි සමාජයීය හා පාරිසරික බලපෑම සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අදාළ අවදානම* *15*

7.1. ව්‍යාපෘතියෙන් සිදුවන සාධනීය බලපෑම 15

7.2. අහිතකර බලපෑම 15

*8. සැලකිය යුතු පාරිසරික සහ සමාජීය බලපෑම්* *19*

8.1. මූලික සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු: කොන්ත්‍රාත්කරුවන් සඳහා සම්මත ගිවිසුම් අවශ්‍යතාවන්ට අමතරව විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂණ නිර්දේශයන් 19

8.2 ළමා හා බලහත්කාර ශ්‍රමය 19

*9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව* *19*

9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම 20

9.2 තාවකාලිකව ඉවත් කිරීම 20

9.3 හානියට පත් ඉදිකිරීම් ව්‍යුහයන් ඉවත් කිරීම (අබලි ද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව ඉඩම් හිමිකරුවන්ගේ නිර්දේශ ලබා ගැනීම) 20

9.4 ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් දේපළ හා භාවිතයන් අහිමි වීම වෙනුවෙන් වන්දි ගෙවීම 20

ඉදිකිරීම් වලදී යටිතල පහසුකම්වලට හෝ මාර්ගයේ වෙනත් කිසියම් අංගයකට යම් හානියක් සිදුවුවහොත් වන්දි ගෙවිය යුතුයි. 20

9.5 මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය - පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වේ 20

9.6 පිරිසැලසුම් පදනම් කරගත් පාරිසරික/සමාජයීය කළමනාකරණය 20

9.7 ඉදිකිරීම් ක්‍රියාවලිය තුළ සිදුවන බලපෑම් අවම කිරීම 22

*10. මහජන සහ පාර්ශවකරුවන්ගේ උපදේශනය පවත්වා ඇති සහ/හෝ පවත්වනු ලබන මහජන උපදේශන 28*

*11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද Covid-19 වැළැක්වීමේ පියවර 28*

*12. කම්කරු කළමනාකරණය 28*

*13. නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනයන්හි අනුමැතිය ලබා ගැනීම 29*

13.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 29

13.2 ව්‍යාපෘතියට අදාළ රජයේ/ඉඩම් හිමියන්ගේ අනුමැතිය 29

13.3 ඉඩම් හිමිකාරිත්වයෙන් කැමැත්ත / විරුද්ධත්වයක් නොමැති බව / නීත්‍යානුකූල ගිවිසුම 29

*14. මෙම ව්‍යාපෘතිය සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය 30*

*15. ව්‍යාපෘති තොරතුරු නිකුත් කිරීම 31*

*ඇමුණුම 1: හඳුනාගත් ස්ථානයේ ස්වභාවය සහ උපදේශනය දැක්වෙන ඡායාරූප 32*

*ඇමුණුම II - ස්ථානීය අංක 76 - L2 ඇල්ල-වැල්ලවාය මාර්ගය (25/1 බෝක්කුව අසල) සංකල්පීය (යෝජිත නැරඹුම් මැදිරිය) සංවර්ධන සැලැස්ම 33*

## ඡායාරූප ලැයිස්තුව

රූපය 1. යෝජිත ආපදා අවදානම් අවමකරණ ස්ථානයට ප්‍රවේශ මාර්ගය ........ 8
රූපය 2- ආපදා අවමකරණ ස්ථානයේ බෑවුම් උන්නතාංශය චන්ද්‍රිකා රූපයකින් ........ 9
රූපය 3 - ප්‍රදේශයේ වර්ෂාපතනය ........ 10
රූපය 4 - මෙම ස්ථානයේ හරස්කඩ, ඉඩම් පරිහරණය, අවදානම් සංරචකයන් සහ ස්ථානයේ විශේෂ ලක්ෂණ ........ 11
රූපය 5 - ආපදා අවදානම අවමකිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග ........ 12
රූපය 6 - අවම කිරීමේ ස්ථානයහි හරස්කඩ, ඉඩම් පරිහරණය සහ මූලික තොරතුරු ........ 13
රූපය 7 - ව්‍යාපෘති කටයුතු හේතුවෙන් බලපෑමට ලක්විය හැකි සංරචකයන් ........ 15

## වගු සටහන් ලැයිස්තුව

වගුව 1: අහිතකර බලපෑම් සහ බලපෑම්වල තීව්‍රතාවය ........ 16
වගුව 2: පිරිසැලසුම් අදියරයේදී පාරිසරික සමාජයීය නිර්දේශ ........ 20
වගුව 3: ES & HS කළමනාකරණයට අනුකූල වීම සඳහා “කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය” ........ 22
වගුව 4: ස්ථානීය විශේෂිත ES & HS අවමකරණ පියවරයන් ........ 24
වගුව 5: ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය ........ 27
වගුව 6: නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව එකඟතාව සහ අනුමැතිය ........ 29
වගුව 7: අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත (තාවකාලික) කාල රාමුව ........ 30
වගුව 8: යෝජිත තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණය ........ 31

# කෙටි යෙදුම්

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය |
| CEB | ලංකා විදුලි බල මණ්ඩලය |
| DFC | වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව |
| DS | ප්‍රාදේශීය ලේකම් |
| DWLC | වන ජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව |
| EH & S | පාරිසරික, සෞඛ්‍ය සහ සමාජයීය |
| E&SU of PMU | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික සහ සමාජයීය ඒකකය |
| ESMF | පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව |
| ESMP | පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම |
| GN | ග්‍රාම නිලධාරී |
| GOSL | ශ්‍රී ලංකා ආණ්ඩුව |
| GSMB | භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය |
| LHS | වම් පස පෙදෙස |
| NBRO | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය |
| SSE & SMP | ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම |

# 1. හැඳින්වීම

## 1.1 ව්‍යාපෘති සාරාංශය

මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ පළාත් 6කට අයත් දිස්ත්‍රික්ක 11ක ආපදා අධි අවදානම් කලාපවල පිහිටා ඇති අස්ථායී බෑවුම් සඳහා පිළියම් යෙදීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරනු ලබයි. ඒ සඳහා ණය ආධාර සපයනු ලබන්නේ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසිනි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී AIIB හා ශ්‍රී ලංකා රජයේ නීතිරීති සහ පාරිසරික හා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයන්ට අනුකූල වීම අත්‍යවශ්‍ය වේ. AIIB හි පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිමය අවශ්‍යතාව අනුව ව්‍යාපෘතියේ ස්වභාවය සහ එහි ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතිය සඳහා පාරිසරික සහ සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවක් (ESMF) නිර්මාණය කළ යුතුය.

මෙම පාරිසරික හා සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවෙහි (ESMF) අරමුණ වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී AIIB හි ආරක්ෂණ ක්‍රමවේද සහ ජාතික පාරිසරික ප්‍රඥප්ති හා සමාජයීය ප්‍රඥප්ති පිළිබඳ මාර්ගෝපදේශ සැපයීමය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) නම් කර ඇත. ව්‍යාපෘතියට සම්බන්ධ වන සියළුම පාර්ශවයන් පාරිසරික හා සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව (ESMF) යටතේ සමස්ථ ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරන ලද පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇතැයි NBRO විසින් අපේක්ෂා කෙරේ. එමගින් ව්‍යාපෘති කාලසීමාව අතරතුර පරිසරයට හා සමාජයට වන බලපෑම අවම වනු ඇත.

පාරිසරික හා සමාජයීය සැකැස්ම සහ සෞඛ්‍ය හා ආරක්ෂණ තත්ත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින් එවැනි වෙනස්වන විශේෂිත තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ. එබැවින් පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුවට (ESMF) අනුව එක් එක් නායයෑම් ස්ථානයට අදාළව පාරිසරික හා සමාජයීය කළමනාකරණ තක්සේරු වාර්තා (SSE & SMP) සැකසිය යුතුය. මෙම ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජ කළමනාකරණය පිළිබඳ සැළසුම් මගින් ව්‍යාපෘති කටයුතු සැලසුම් කිරීම, පිරිසැලසුම් කිරීම (Design), ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම යන අදියරයන්හි දී පාරිසරික, සමාජයීය, සෞඛ්‍ය, සහ ආරක්ෂණ කළමනාකරණය සම්බන්ධයෙන් සලකා බැලිය යුතු අංශයන් පිළිබඳව අවශ්‍ය මාර්ගෝපදේශයන් සපයනු ඇත.

**ඇල්ල-වැල්ලවාය පාර (25/1 බෝක්කුව අසල)** පිහිටි නායයෑම් ආපදා අවදානම් අවමකරණ ස්ථානයට අදාළ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම පහත දැක්වේ. ප්‍රදේශයේ පාරිසරික හා සමාජයීය සාධකයන් පිළිබඳව සිදු කළ පුළුල් අධ්‍යයනයකින් පසු මෙම සැලැස්ම සකස් කර ඇති අතර එමගින්:

i. ව්‍යාපෘතියේ බලපෑමට හසුවන ප්‍රදේශයේ පවත්නා සංවේදී පාරිසරික හා සමාජයීය ලාක්ෂණිකයන් හඳුනා ගැනීම
ii. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවිය හැකි සුවිශේෂී පාරිසරික හා සමාජයීය බලපෑම් හඳුනා ගැනීම
iii. යෝජිත අවදානම් අවමකරණ පියවරයන්
iv. මෙම ව්‍යාපෘතියට විශේෂිත යෝග්‍ය පාරිසරික හා සමාජයීය අවශ්‍යතාවන් හඳුනා ගැනීම
v. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලය තුළ අනුගමනය කළ යුතු විශේෂිත පාරිසරික හා සමාජයීය රෙගුලාසි සහ විධි විධාන පිළිබඳ අධ්‍යයනය කිරීම

## 1.2 අපේක්ෂිත පරිශීලකයින්

යෝජිත ව්‍යාපෘතිය සහ නායයෑම් ආපදා අවමකරණ පියවරයන් හේතුවෙන් ඇතිවිය හැකි ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය ගැටලු පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් මෙම ලේඛනය තුළින්

සපයනු ලබයි. ව්‍යාපෘතියේ ESMP සංරචක ක්‍රියාත්මක කිරීමේදී නායයෑම් ආපදා අවදානම්කරණ පිරිසැලසුම් සිදු කරනු ලබන කණ්ඩායම (Landslide mitigation design team), ව්‍යාපෘති කලමණාකරන ඒකකය (Project Management Unit) සහ කොන්ත්‍රාත්කරු විසින් එම තොරතුරු භාවිත කරනු ඇත. ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ තක්සේරු වාර්තා (SSE & SMP) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි වෙබ් අඩවියේ (NBRO Website) ප්‍රදර්ශනය කරන අතර මේ පිළිබඳව උනන්දුවක් දක්වනු ලබන ඕනෑම පාර්ශවයකට (මහජනතාවට හෝ පාර්ශවකාර සංවිධානවලට) ඒවා පරිශීලනය කිරීමට හැකියාව ලැබේ. එමගින් ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට ප්‍රථමව කොන්ත්‍රාත්කරු විසින් සකස් කරනු ලබන පාරිසරික හා සමාජයීය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මේ (SS- ESMAP) කොටසක් වන ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම්වලට අවශ්‍ය පදනම නිර්මාණය කරනු ඇත.

## 2. ව්‍යාපෘතියේ සහ ස්ථානයේ විස්තරය

### 2.1. යෝජිත ආපදා අවදානම් අවමකරණ ස්ථානයේ නම

සංශෝධිත අංක 76-L2 දරණ ආපදා අවදානම් අවමකරණ ස්ථානය, බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල- වැල්ලවාය මාර්ගයේ 25/1 බෝක්කුව අසල පිහිටා ඇත.

### 2.2. ස්ථානයේ විස්තරය

මෙම යෝජිත ආපදා අවදානම් අවමකරණ ස්ථානය, ඌව පලාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රාවණා ඇල්ල නිලධාරී කොට්ඨාශයේ පිහිටා ඇත.

**හඳුනාගත් ස්ථානයේ ඛණ්ඩාංක→** 6.861433°N සහ 81.054333°E

***උන්නතාංශය*** →මෙම ස්ථානයේ උන්නතාංශය අඩි 2100-2500 ( මීටර් 640-762 AMSL) පමණ වේ.

***අඩවියට ආසන්නතම නගරය*** - ඇල්ල ආසන්නතම වාණිජ නගරය ලෙස හඳුනාගත හැකි අතර, අවම කිරීමේ අඩවියේ සිට කිලෝමීටර 4ක් පමණ දුරින් පිහිටා ඇත.

**ප්‍රවේශ මාර්ගය→** අවම කිරීමේ ස්ථානය ඇල්ල නගර සීමාවට යාබදව පිහිටා ඇති අතර වැල්ලවාය- ඇල්ල - කුඹල්වෙල මාර්ගය (A23)හරහා පහසුවෙන්ම ළඟා විය හැකිය. බදුල්ල - බණ්ඩාරවෙල පාරේ (A16) පිහිටා ඇති කුඹල්වෙල හන්දියෙන් වැල්ලවාය - ඇල්ල - කුඹල්වෙල මාර්ගය (A23) දෙසට ගමන් කර එම මාර්ගයේම කිලෝමීටර් 3.2 ක් ගිය පසු ඇල්ල නගරයට ළඟා විය හැකි අතර අවම කිරීමේ ස්ථානය පිහිටා ඇත්තේ ඇල්ල නගරයේ සිට කිලෝමීටර් 1.6 ක් දුරිනි.

රූප සටහන 01 මඟින් මෙම ස්ථානයට ප්‍රවේශ වීමේ මාර්ගය පෙන්නුම් කරයි.




*රූපය 1. යෝජිත ආපදා අවදානම් අවමකරණ ස්ථානයට ප්‍රවේශ මාර්ගය*

## 2.3 භූ විද්‍යාත්මක ස්වභාවය හා ඉඩම් හිමිකාරිත්වය

යෝජිත අවම කිරීමේ ස්ථානය ඇල්ල-වැල්ලවාය මාර්ගයේ (25/1 බෝක්කුව අසල) පිහිටා ඇත. මෙම ස්ථානයේ සාමාන්‍ය භූ විෂමතාවය ප්‍රවේශ මාර්ගයේ සිට බෑවුමේ අවසානය දක්වා මීටර් 341 පමණ වන හරස්කඩ සැලකූ විට, අංශක 45 සිට 60 දක්වා වෙනස් වන බෑවුමකින් සමන්විත වේ. බෑවුමේ ප්‍රධාන කොටස අංශක 50-60 අතර උච්චාවචනයක් පෙන්වන අතර ඉහළම කොටසේ දළ බෑවුමක් නිරීක්ෂණය කළ හැක. හැක.

ප්‍රදේශයේ බෑවුම් අනුක්‍රමය ඊසාන-නැගෙනහිර දිශාවට අංශක 70ක් පමණ වන අතර මෙම ප්‍රදේශයේ අධික කුස්තූර සහිත ජීර්ණිත පාෂාණ හෝ ක්වාර්ට්සොෆෙල්ඩ්ස්පතික් නයිස් පාෂාණ වලින් සමන්විත වේ.

අවම කිරීමේ ස්ථානයේ භූමි ප්‍රමාණය වර්ග මීටර් 20,000 ක් පමණ වේ. මාර්ගය ඉදිකිරීමේදී ස්වභාවිකව පිහිටි දළ බෑවුම යම් දුරකට වෙනස් කර ඇති අතර ඇල්ල කඳුකරයේ සහකාර කළමනාකරු, තරංග රුක්ෂාන් මහතා පවසන පරිදි මෙහි භූමි හිමිකාරීත්වය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වේ.




*රූපය 2- ආපදා අවමකරණ ස්ථානයේ බෑවුම් උන්නතාංශය චන්ද්‍රිකා රූපයකින්*

## 2.4. ප්‍රදේශයේ දේශගුණික හා කාලගුණික තත්ත්වය

ශ්‍රී ලංකාවේ වැඩිම සංචාරක ආකර්ෂණයක් හිමිකරගෙන සිටින ඇල්ල, එහි පවතින පාරිසරික සුන්දරත්වය හා දේශගුණය නිසාම සංචාරකයින්ගේ ජනප්‍රිය ගමනාන්තයක් බවට පත්ව ඇත. එසේම ඇල්ල කැපෙන්-ගයිගර් (Kappen-Geiger) වර්ගීකරණයට අනුව සමක (හෝ නිවර්තන වැසි වනාන්තර) දේශගුණයක් භුක්ති විඳින නගරයක් ලෙස නම් කරයි. ඇල්ලේ වාර්ෂික සාමාන්‍ය උපරිම උෂ්ණත්වය 27°C (දෙසැම්බර් මාසයේ 25°C සිට අප්‍රේල් මාසයේ 28°C දක්වා පරාසයක පවතී) ක් පමණ වන අතර වාර්ෂික වර්ෂාපතනය 4900mm පමණ වේ. තවද, එම වර්ෂාපතනය ජනවාරි මාසයේ දී අවම අගයක් හා සහ ඔක්තෝබර් මාසයේ දී උපරිම අගයක් වාර්තා කරයි. (ජනවාරි මාසයේදී අවම වශයෙන් 224mm සහ ඔක්තෝම්බර් මාසයේදී උපරිම 744mm වේ)

මාර්තු සිට ජූනි දක්වා වූ ගිම්හාන සමය තුළ හා දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා වූ ශීත සමය තුළ ඇල්ල සංචාරක කේන්ද්‍රස්ථානය සංචාරකයින්ට නැරඹීමට වඩාත් සුදුසුවේ. තවද, ජූලි සිට නොවැම්බර් දක්වා කාලය අඩු මෝසම් සහිත සමයක් ලෙස සලකනු ලබන අතර මෝසම් සමයේදී සංචාරක ගමනාගමනය යම් මට්ටමකට සීමා සහිත වෙයි. (මූලාශ්‍රය- https://www.triphobo.com)

එබැවින්, අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී සංචාරක කාලවකවානු පිළිබඳවත් වර්ෂාපතනය අඩු කාල සීමාවනුත් සලකා බැලීම අතිශය වැදගත් වේ. ඒ අනුව නම්‍යශීලී කාලසටහනක් සකස් කිරීම තුලින් ඒ මඟින් ඇති කරන බලපෑම අවම වනු ඇත.




*රූපය 3 - ප්‍රදේශයේ වර්ෂාපතනය*

*(මූලාශය: whereandwhen.net: [https://www.whereandwhen.net/when/central-and-south-asia/sri-lanka/ella/](https://www.whereandwhen.net/when/central-and-south-asia/sri-lanka/ella/))*

## 3. නායයෑම් ආපදා සිදුවීම් පිළිබඳ තොරතුරු

### 3.1 පෙර වාර්තා වන ලද සිදුවීම්

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) බදුල්ල දිස්ත්‍රික් කාර්යාලීය නායයෑම් පර්යේෂණ හා අවදානම් අවම කිරීමේ අංශයේ අවදානම් තත්ව විමර්ශනයේ දී, පහත සඳහන් ස්ථානය වැල්ලවාය- ඇල්ල මාර්ගය (A23) දෙසට ගමන් කරන අස්ථායී බෑවුමක් ලෙස හඳුනාගෙන ඇත. කදු මුදුනේ ඇති ප්‍රවේශ මාර්ගය හරහා දිවෙන ජලාපවහන පද්ධතිය, බෑවුම් අසාර්ථක වීමට ප්‍රධාන හේතුවයි.

ඉහළ බෑවුමේ ජලාපවහන මාර්ගයක් ඉදි නොකළහොත් සිරස් බෑවුම හරහා විශාල ජල කදක් සෘජුවම ගලා යන අතර, වැසි ජලය බැසයාමට නිසි කාණු පද්ධතියක් නොතිබීම නිසා ගලායන ජල මාර්ගය මධ්‍යයේ ජල පීඩනය වැඩි විය හැක. ඇල්ල - වැල්ලවාය ප්‍රධාන මාර්ගය ඉදිකිරීමේදී බෑවුම් වෙනස් කිරීම් සඳහා ඉංජිනේරු බෑවුම් ස්ථායීතා සම්මතයන් අනුගමනය කර නොමැති වීම එයට හේතුවයි. 2020 වර්ෂයේදී, බෑවුම හරහා පාලනයකින් තොරව වැසි ජලය ගලායාම හේතුවෙන් පසෙහි ඉහළ ස්ථරයේ විස්ථාපනයක් සිදු වී ඇත. ඛාදනය වීමෙන් අවසාදනය වන ලද පාංශු හා පාෂාණ කොටස් මෙම අස්ථායී බෑවුමේ විරුද්ධ පැත්තේ තැන්පත්වී ඇති ආකාරය ක්ෂේත්‍ර චාරිකාවේදී නිරීක්ෂණය කළ හැකි විය.

රූප සටහන 4 මගින් මෙම ස්ථානයේ හරස්කඩ, ඉඩම් පරිහරණය, අවදානම් සංරචකයන් සහ ස්ථානයේ විශේෂ ලක්ෂණ දැක්වේ.




*රූපය 4 - මෙම ස්ථානයේ හරස්කඩ, ඉඩම් පරිහරණය, අවදානම් සංරචකයන් සහ ස්ථානයේ විශේෂ ලක්ෂණ*

### 3.2. නායයෑමේ බලපෑම් සහ ප්‍රතිවිපාක

දැඩි වර්ෂා කාලවලදී අස්ථායී බෑවුම් වල කැපුම් මාර්ග හරහා පාංශු ස්තර කඩා වැටීමෙන් ඇල්ල - වැල්ලවාය මාර්ගයේ (ඒ23) ගමන් ගන්නා වාහන වලට දැඩි අවදානමක් පවතී. විශේෂයෙන්ම, සෘතුමය කාලවලදී සංචාරකයින් විශාල පිරිසක් මෙය ප්‍රධාන ප්‍රවේශ මාර්ගය ලෙස භාවිතා කරන අතර විවේක ගැනීමට හෝ ඇල්ලේ දර්ශනීය සුන්දරත්වය විඳීමට මාර්ගය අසල නතර වේ. එවැනි තත්වයක් තුළ මෙය ඔවුන්ගේ ජීවිතයට අනතුරක් විය හැකිය. එසේම, පහළ බෑවුමේ වනාන්තර කොටස් කිහිපයක් පිහිටා ඇති බැවින් බෑවුම් අසාර්ථක වීම හේතුවෙන් වනාන්තර ආවරණය අහිමි වීමේ සම්භාවිතාව ඉහළ ය.

### 3.3. නායයෑම් ආපදා අවදානම අවමකිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග

බෑවුම් කඩාවැටීමේ සිදුවීම් පිළිබඳ වාර්තා වීමත් සමඟ, NBRO විසින් ඇල්ල - වැල්ලවාය මාර්ගයේ (25/1 බෝක්කුව අසල) පිහිටි මෙම ස්ථානයේ අස්ථායී බෑවුම පරීක්ෂා ඇති අතර, මෙම ස්ථානයේ ආපදා අවදානම අවම කිරීම සඳහා දැනට යකඩ වැටවල් සහ සංඥා පුවරු ලෙස තාවකාලික පිළියම් යොදවා ඇත. 2020 වර්ෂයේදී පහළට රූරා පතිත වන ලද පාෂාණයක් එම ස්ථානයෙන් ඉවත් කර මාර්ගයේ විරුද්ධ පැත්තේ තබා ඇත.

|  |  |
|---|---|
| *රූප සටහන් අංක 04 අ - ඇල්ල-වැල්ලවාය (A23) මාර්ගයට සකස් කර ඇති යකඩ වැට* | *රූප සටහන් 04 ආ - නායයෑම් අනතුරු ඇඟවීමේ පුවරු* |

*රූපය 5 - ආපදා අවදානම අවමකිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග*

## 3.4. පදිංචිකරුවන් මෙම ස්ථානයෙන් ඉවත් කිරීම

මෙම අවම කිරීමේ ස්ථානයට ආසන්නයේ කිසිදු ගොඩනැගිල්ලක් නොමැත.

## 3.5. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය (ප්‍රගතිය)

මෙම අවමකරණ ස්ථානය සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියක් අවශ්‍ය නොවේ.




*රූපය 6 - අවම කිරීමේ ස්ථානයහි හරස්කඩ, ඉඩම් පරිහරණය සහ මූලික තොරතුරු*

## 4. බෑවුම් අස්ථායී වීම සිදුව ඇති ප්‍රදේශය හා ආසන්න ප්‍රදේශය පිළිබඳ විස්තරය සහ වර්තමාන අවදානම් මට්ටම

### 4.1. බෑවුම් අස්ථායී ප්‍රදේශය ආශ්‍රිත පරිසරය

බලපෑමට ලක් වූ ස්ථානය ඇල්ල-වැල්ලවාය මාර්ගයේ (25/1 බෝක්කුව අසල) පිහිටා ඇත. මගීන්ට දැඩි අවදානමක් ඇති කරමින් ලිහිල් ජීර්ණිත පාෂාණ කොටස් සහ කැඩී ගිය පාෂාණ කොටස් මෙම ස්ථානයේ දක්නට ඇත. පෙර ආපදා තත්වයේදී ඉවත් කරන ලද පස් සුන්බුන් සහ පාෂාණ කුට්ටි මාර්ගය සහ පහළ බෑවුමේ ඉහළ කොටස අතර ගොඩගැසී ඇත.

අස්ථායී ප්‍රදේශය වෘක්ෂලතා වලින් සමන්විත වේ. ඉහළ බෑවුමේ සිට කුඩා ජල මාර්ගයක් ගලා බසින අතර මගීන්ට පහසුවෙන් භාවිතා කළ හැකි පරිදි මෙම ජල මාර්ගයට සම්බන්ධ කරන ලද නලයක් ඇත. පහළ බෑවුමේ වනාන්තර ප්‍රදේශයක් දැකිය හැකිය. අවම කිරීමේ ස්ථානය අසල වෙනත් වැදගත් ස්මාරක කිසිවක් නොතිබුණි.

මෙම අවම කිරීමේ ස්ථානය ඉතා අඩු ගොඩනැගිලි ඝනත්වයෙන් යුත් පරිසරයක පිහිටා ඇති අතර ආසන්න වශයෙන් මීටර් 500 ක දුරක් තුළ රාවණාගේ ගුහාව සහ රාවණා ඇල්ල විහාරය ආදී සිද්ධස්ථානයන්ද, අවන්හල්, හෝටල්, නේවාසික ස්ථාන, කැෆේ සහ දර්ශන තල ඉතා ස්වල්ප ප්‍රමාණයක්ද දැකගත හැකිය. ඇල්ල-වැල්ලවාය මාර්ගය (A23) රාවණා ඇල්ලට ළඟා විය හැකි ප්‍රධාන පිවිසුම් මාර්ගය නිසා රාවණා ඇල්ලේ ස්වභාවික සුන්දරත්වය අත්විඳීමට සංචාරකයින් විශාල වශයෙන් පැමිණෙන සෘතුමය කාලය තුළ ඇල්ල-වැල්ලවාය (A23) මාර්ගය දෙපස නවතා ඇති වාහනවලින් දැඩි තදබදයක් හට ගනී. නිසි ඉංජිනේරු මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම සහ දුර්වල ජලාපවහන කළමනාකරණය හේතුවෙන් මාර්ගයේ බෑවුම් කඩා වැටීම් කිහිපයක් හඳුනාගත හැකිය. මීට අමතරව, අවම කිරීමේ ස්ථානයේ පහළ බෑවුමේ සිට මීටර් 300 කට ආසන්න දුරින් කිරිඳි ඔය ගලා යනු නිරීක්ෂණය කළ හැක.

### 4.2. වර්තමාන අවදානම් මට්ටම

සිරස් ඉංජිනේරුමය නොවන බෑවුම් කැපීම් අනාගතයේදී ඇතිවිය හැකි බෑවුම් කඩාවැටීම් කෙරෙහි සෘජුවම බලපෑ හැකි අතර අඛණ්ඩව ලැබෙන වර්ෂාපතනය නිසා එහි අවධානම තව තවත් තීව්‍ර කරයි. මේ හේතුවෙන් ඇල්ල - වැල්ලවාය ප්‍රධාන මාර්ගයටත් (A23), පහළ බෑවුමේ පිහිටා ඇති වනාන්තර ප්‍රදේශයටත් බලපෑම් එල්ල වේ.

## 5. ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත අවදානම් අවමකරණ ක්‍රම

යෝජිත ව්‍යාපෘතියේ අරමුණ මෙම අස්ථායී බෑවුම් ප්‍රදේශයේ සිදුවිය හැකි අස්ථාවර වීම් වැළැක්වීම වේ.මෙම අවමකරණ ස්ථානය තුළ ඇල්ල-වැල්ලවාය මාර්ගය (A23),වනාන්තර ප්‍රදේශ ආදිය පිහිටා ඇති බැවින්, අවම කිරීමේ පියවරයන් ලෙස රැඳවුම් බැම්,පාංශු වැරගැන්වුම් , බෑවුම නැවත සකස් කිරීම , මතුපිට තෘණ වැවීම ,ගල් වැටි දැමීම, ආරක්ෂිත දැල් යෙදීම, මතුපිට සහ භූගත ජලාපවහන කළමනාකරණය යනාදී ආපදා අවදානම වැළැක්වීමේ පියවරයන් ක්‍රියාත්මක කෙරේ. එසේම, මෙම ස්ථානය පරිසර සංවේදී සහ සංචාරක ආකර්ෂණ ප්‍රදේශයක පිහිටා ඇති බැවින් පරිසර හිතකාමී අවම කිරීමේ ක්‍රියාමාර්ග වැඩි වශයෙන් යොදා ගැනීමට අපේක්ෂා කරයි.මෙම ස්ථානයේ පවතින අනාගත විභවතාවයන් හඳුනා ගනිමින් ඒවා ප්‍රශස්ත අයුරින් උපයෝජනය කිරීම සඳහා වඩාත් සුදුසු අයුරින් අවම කිරීමේ ස්ථානයේ භූමිය නිර්මාණය කිරීම වඩාත් සුදුසුය.

## 6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් සිදුවිය හැකි සංරචකයන්

බලපෑමට ලක් වූ ස්ථානය ඇල්ල-වැල්ලවාය මාර්ගයේ (25/1 බෝක්කුව අසල) පිහිටා ඇති අතර මෙම පරිශ්‍රය තුළ උන්නතාංශවල වෙනසක් දැකගත හැක. ඒ අනුව, ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් පහත සංවේදී සංරචකයන් අවදානමට ලක් වනු ඇත;

- ඇල්ල - වැල්ලවාය ප්‍රධාන මාර්ගය, මගීන් හා පදිකයින
- පහළ බෑවුමේ පිහිටා ඇති වනාන්තර

| | |
|---|---|
|   |  |
| *රූප සටහන 5 අ - බෑවුම් අසාර්ථක වීමට ආසන්නව පිහිටි ඇල්ල-වැල්ලවාය :23* මාර්ගය* | *රූප සටහන 5 - අවම කිරීමේ අඩවියේ පහළ බෑවුමේ පිහිටා ඇති වනාන්තර* |

*රූපය 7 - ව්‍යාපෘති කටයුතු හේතුවෙන් බලපෑමට ලක්විය හැකි සංරචකයන්*

## 7. සිදුවිය හැකි සමාජයීය හා පාරිසරික බලපෑම සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අදාළ අවදානම

### 7.1. ව්‍යාපෘතියෙන් සිදුවන සාධනීය බලපෑම

■ මෙම ව්‍යාපෘතිය මගින් ඇල්ල - වැල්ලවාය (23) මාර්ගයේ ඉහළ කොටසේ තවදුරටත් බෑවුම් කඩා වැටීම් අවම කරනු ඇත. එබැවින්, යෝජිත ව්‍යාපෘතිය හරහා වර්ෂා කාලවලදී මගීන්ගේ, සංචාරකයින්ගේ සහ පදිකයින්ගේ ආරක්ෂාව සැලකිය යුතු ලෙස වැඩි කරන අතර එය වසර පුරා මෙම මාර්ගය විවෘතව තබා ගැනීමට මෙන්ම අඛණ්ඩ ගමනාගමනයට ඉඩ සලසයි.

■ මෙම ස්ථානය රට තුළ ඉහළ සංචාරක ආකර්ෂණයක් ඇති ස්ථානයක් ලෙස ප්‍රචලිත බැවින් වර්ෂා කාලයේදී සංචාරක ව්‍යාපාරයට බාධාවක් නොවන අයුරින් මගීන්ගේ ආරක්ෂාව තහවුරු කරනු ලබයි.

■ මෙම ව්‍යාපෘතිය හරහා අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී පහළ බෑවුමේ පිහිටා ඇති වන ආවරණයේ ආරක්ෂාව වැඩි වනු ඇත.

### 7.2. අහිතකර බලපෑම

මෙම ව්‍යාපෘතියෙන් යෝජිත ආපදා අවදානම් අවමකරණ පියවරයන් බෑවුම් අස්ථායී වීමේ ඉහළ සම්භාවිතාවක් ඇති ප්‍රදේශයට පමණක් අදාළව ක්‍රියාත්මක කරනු ලබයි. එබැවින් ව්‍යාපෘතියෙන් ඇතිවන අහිතකර බලපෑම් මෙම ස්ථානයට හා ඉදිකිරීම් කාලසීමාවට පමණක් සීමා වේ.

*වගුව 1: අහිතකර බලපෑම් සහ බලපෑම්වල තීව්‍රතාවය*

| ඉදිකිරීම් කාලය අතරතුර සිදුවන බලපෑම් | බලපෑමේ තීව්‍රතාව |
|---|---|
| **7.2.1** ජල විද්‍යාත්මක හා ජලයේ ගුණාත්මකභාවයට සිදුවන බලපෑම | |
| **7.2.1.1 ප්‍රදේශයේ ජලාපවහන රටාවේ බලපෑම්**<br>අස්ථායී බෑවුම් නැවත සකස් කිරීම, පස් ඉවත් කිරීම සහ ජල ප්‍රවාහ මාර්ග වෙනස්කිරීම යනාදිය හේතුවෙන් ප්‍රදේශයේ පවතින මතුපිට සහ උප මතුපිට ජලාපවහන රටාවට බාධා ඇතිවේ.<br>මතුපිට සහ භූගත ජලාපවහන කළමනාකරණය වැනි අවමකරණ ක්‍රියාමාර්ග කෙරෙහි මෙම ව්‍යාපෘතිය විශාල වශයෙන් අවධානය යොමු කරනු ඇත. ජල මාර්ගයන් වෙනස් කිරීම, ජලාපවහන මාර්ග වැඩිදියුණු කිරීම ආදිය නිසා උප මතුපිට ජලාපවහනය වැඩි වී වැසි කාලවලදී මෙම ප්‍රදේශය හරහා වැඩි ප්‍රවේගයකින් ජලය ගලායාමක් සිදුවිය හැක. එසේම,කැණීම් සහ බිම් එළිපෙහෙළි කිරීම් ආදී ක්‍රියාකාරකම් නිසා වැසි දිනවල බෑවුමේ පහළට මඩ සමඟ මතුපිට ජලය අඛණ්ඩව ගලා යාම සිදු වේ. | **වැදගත්** |
| **7.2.1.2. ජල දූෂණ බලපෑම්**<br><br>"කිරිඳිඔය" යෝජිත අවමකරණ ස්ථානයේ පහළ බෑවුම හරහා ගලා බසින අතර ඊට යාබදව කිසිදු නිවාසයක් නිරීක්ෂණය කළ නොහැක. ඉදිකිරීම් අතරතුර, විශේෂයෙන් වැසි කාලය තුළ ජල මූලාශ්‍ර සමඟ ඉදිකිරීම් ද්‍රව්‍ය මිශ්‍ර වීමේ හැකියාවක් පවතී. තවද කිරිඳිඔය ජල මූලාශ්‍රය මත යැපෙන කුටුම්බ සිටිය හැකි අතර මෙම ස්ථානයේ කිසියම් බලපෑමක් නිර්මාණය වන්නේ නම් එය මෙම ඔය භාවිතා කරන්නන්ටද බලපානු ඇත. | **අඩු වැදගත්** |
| **7.2.1.3 ඛාදන බලපෑම්**<br>මෙම ස්ථානයේ අවම කිරීමේ කටයුතු බොහෝ දුරට ජලාපවහන මාර්ග වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. එබැවින් වැසි සමයේදී අධික ජල ප්‍රවාහයක් ජනනය වී නිරාවරණය වූ පෘෂ්ඨය හරහා ගමන් කරනු ඇත. එසේම,බෑවුමේ ඉහළ ප්‍රදේශයේ ස්වභාවික ජල උල්පතක් ගලායන අතර එබැවින්, නිසි අවම කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය නොකළහොත්, එමඟින් ඛාදන බලපෑම් වේගවත් කරනු ඇත. | **වැදගත්** |
| **7.2.1.4 විවෘත මලපහ කිරීම් සහ ජලය ආශ්‍රයෙන් පැතිරිය හැකි රෝග තත්ත්වයන්**<br>නායයෑම් අවම කිරීමේ ස්ථානයට යාබදව කිසිදු ගොඩනැගිල්ලක් පිහිටා නැත.. එබැවින්, ඉදිකිරීම් භූමියේ කම්කරුවන් මෙම ස්ථානය විවෘත මළපහ කිරීම් වලට භාවිතා කිරීමේ හැකියාවක් ඇත. | **ඉතා වැදගත්** |
| **7.2.1.5 පහළ බෑවුමේ ජල මූලාශ්‍ර භාවිත කරන්නන්ට සිදුවිය හැකි බලපෑම**<br><br>"කිරිඳිඔය" යෝජිත අවමකරණ ස්ථානයේ පහළ බෑවුම හරහා ගලා බසින අතර ඊට යාබදව නිවාස සහ ගෙවතු කිහිපයක් නිරීක්ෂණය කළ හැක. ඉදිකිරීම් අතරතුර, විශේෂයෙන් වැසි කාලය තුළ ජල මූලාශ්‍ර සමඟ ඉදිකිරීම් ද්‍රව්‍ය මිශ්‍ර වීමේ හැකියාවක් පවතින අතර කිරිඳිඔය ජල මූලාශ්‍රය පදනම් කරගත් ජනතාවට මෙය සෘජුවම බලපානු ඇත. | **නොවැදගත්** |
| **7.2.1.6 භූගත ජල මට්ටමට සහ ජලයේ ගුණාත්මකභාවයට සිදුවන බලපෑම**<br>ඉදිකිරීම් කටයුතු අතරතුර ජලය බැසයාම හේතුවෙන් ජලධරය තුල අධික ලෙස ජලය තැන්පත් වී ජල භූගත ජල මට්ටම පහත වැටීමේ හැකියාවක් ඇත. මෙම ප්‍රදේශයේ පවතින මතුපිට ජල ප්‍රවාහයන් සමඟ සිමෙන්ති/ ඇඹරුම් ද්‍රව්‍ය ඇතුළු ඉදිකිරීම් ද්‍රව්‍ය එකතුවීම හෝ මිශ්‍රවීම සිදුවිය හැක.එය ජල ප්‍රවාහවලට අනවශ්‍ය ද්‍රව්‍ය එකතු වී ගුණාත්මක බව තාවකාලිකව පිරිහීමට හේතු වේ. තවද ඉදිකිරීම් කාලය තුළ රසායනික ද්‍රව්‍යවලින් පිටවන අනතුරුදායක අපද්‍රව්‍ය, ඉදිකිරීම් කටයුතුවලින් අපතේ යන ජලය සහ පූතික පද්ධතිවලින් පිටවන අපද්‍රව්‍ය යනාදිය භූගත ජලයේ ගුණාත්මක | **වැදගත්** |

| | |
|---|---|
| භාවයට අහිතකර බලපෑම් ඇති කරයි.එසේම, බෑවුම් ප්‍රදේශයේ ඉදිකිරීම් කටයුතු හේතුවෙන් භූගත ජල මට්ටම පහළ වැටීම නිසා මාර්ගය ආසන්නයේ ජලය කාන්දු වී සිඳී යයි. | |
| **7.2.2 පාරිසරික බලපෑම** | |
| **7.2.2.1 ශබ්දය හා කම්පන**<br>ඉදිකිරීම් අවදියේදී භූමිය සකස් කිරීමේදී සහ භූමි අලංකරණයේදී යන්ත්‍ර උපකරණවලින් ශබ්දය සහ කම්පනය අපේක්ෂා කළ හැකිය. වනජීවී සංරක්‍ෂණ ප්‍රදේශයක මෙම ව්‍යාපෘතිය සිදුකෙරෙන බැවින් එහි බලපෑම සැලකිය යුතු මට්ටමක පවතින අතර, යන්ත්‍ර සූත්‍රවලින් ජනනය වන ඝෝෂාව නිසා මෙම සංරක්ෂණ භූමියේ සිටින සතුන්ට එය බාධාවක් වනු ඇත. එසේම මෙම ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින්ගේ මූලික අභිප්‍රාය ඇල්ලේ සොබා සෞන්දර්යය නිස්කලංකව විඳ ගැනීම වන බැවින් ඇල්ල - වැල්ලවාය (A23) මාර්ගය භාවිතා කරන සංචාරකයින්ට මෙන්ම මගීන්ටද මෙම ශබ්ද හා කම්පන බලපෑම් හේතුවෙන් බාධා ඇති වෙයි. | **ඉතා වැදගත්** |
| **7.2.2.2 වායු දූෂණ බලපෑම**<br>මෙම වැඩබිම තුල ඉඩම් පිරිසිදු කිරීම, ඩීසල් එන්ජින් ක්‍රියාත්මක කිරීම, ව්‍යුහයන් කඩා ඉවත් කිරීම සහ ගිනි තැබීම වැනි වායු දූෂණයට දායක වන ඉදිකිරීම් ක්‍රියාකාරකම් සිදුවේ. තවද, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ වැරදි ලෙස හැසිරවීම සහ ඉදිකිරීම් ද්‍රව්‍ය නිසියාකාරව ගබඩා නොකිරීම නිසා දූවිලි අංශු ජනනය විය හැකිය. ඇල්ල වනජීවී සංරක්ෂණ ප්‍රදේශය ආශ්‍රිතව ජීවත්වන වනජීවී වාසස්ථාන පරිසර දූෂණයට ඉතා සංවේදී වන අතරම,ඉදිකිරීම් කාලසීමාව තුළ අවම කරන ස්ථානය ආසන්න මාර්ගයේ ගමන් කරන මගීන් සහ සංචාරකයින් දූවිලි අංශු හේතුවෙන් පීඩාවට පත් වේ. | **ඉතා වැදගත්** |
| **7.2.2.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටලු**<br>ආහාර අපද්‍රව්‍ය, ඉදිකිරීම් අදියරේදී ජනනය වන ඉදිකිරීම් අපද්‍රව්‍ය ආදී ඝන අපද්‍රව්‍ය දුර්වල ලෙස කළමනාකරණය කිරීමෙන් මිනිසුන්ට අපහසුතා ඇති විය හැකි අතර,එම අපද්‍රව්‍ය ජලාපවහන මාර්ග අවහිර වීමෙන් ජලයෙන් සම්ප්‍රේෂණය වන වාහකයන් සහ රෝග කාරක උවදුර සඳහා බෝවන ස්ථාන නිර්මාණය වීමේ හැකියාවක් ඇත.ඝන අපද්‍රව්‍ය පසට එක්වීමෙන් පාංශු දූෂණයක් විය හැකි අතර, ඉදිකිරීම් කාලය තුළ නිසි බැහැර කිරීමේ යාන්ත්‍රණයක් නොමැති නම් විශේෂයෙන් වනජීවී සංරක්ෂණ ප්‍රදේශයට විවිධ පාරිසරික බලපෑම් ඇති විය හැකිය. එබැවින් අවම කිරීමේ කටයුතු පරිසර සංවේදී ප්‍රදේශයක සිදුවන බැවින් පරිශ්‍රයට පිටතින් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානයක් තැබිය යුතුය. | **ඉතා වැදගත්** |
| **7.2.2.4 පිපුරුම් සහ අන්තරායකර ද්‍රව්‍ය**<br><br>බලපෑමට ලක් වූ ප්‍රදේශයේ විශාල පාෂාණ කීපයක් ඇති බැවින්, පාෂාණ පිපිරවීම අපේක්ෂා කරන්නේ නම් පුපුරණ ද්‍රව්‍ය භාවිතා කළ හැකිය. එහිදී අනාරක්ෂිත භාවිතය හේතුවෙන් ඇල්ල - වැල්ලවාය මාර්ගයේ ගමන් ගන්නා මගීන්ට, සංචාරකයින්ට සහ ඉදිකිරීම් කටයුතු වල නියැලෙන ශ්‍රම බලකායට  අවදානමක් විය හැකිය. | **වැදගත්** |
| **7.2.3 පරිසර විද්‍යාත්මක බලපෑම** | |
| **7.2.3.1 ශාක ව්‍යාප්තියට සිදුවන බලපෑම**<br><br>මෙම පරිසරයේ දක්නට ලැබෙන බොහෝ ශාක වර්ග ආවේණික, තර්ජනයට ලක්වූ හෝ IUCN මගින් රතු දත්ත ලැයිස්තුවට ඇතුළත් කරන ලද ශාක නොවේ. වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රකාශය අනුව "කිසියම් වන සතෙකු දඩයම් කිරීම, වෙඩි තැබීම, මරා දැමීම, අල්ලා ගැනීම හෝ ඕනෑම වන සතෙකු මැරීමට හෝ අල්ලා ගැනීමට උපකරණ සැකසීම, බිත්තර හෝ කුරුල්ලන් හෝ උරගයින් බිත්තර ගැනීම හෝ විනාශ කිරීම, අභිජනන ස්ථානයට හානි කිරීම සපුරා තහනම් වේ" | **ඉතා වැදගත්** |

| | |
|---|---|
| එබැවින්, අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී හිතාමතා හෝ නොදැනුවත්වම පුපුරණ ද්‍රව්‍ය, වායු දූෂණ කාරක, ශබ්ද සහ කම්පන බලපෑම් වැනි හේතු කිහිපයක් නිසා අභිජනන ස්ථාන වලට හානි සිදුවිය හැකිය. එබැවින් අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට පෙර වනජීවී සංරක්ෂණ අනුමැතිය අනිවාර්ය වේ. | |
| **7.2.4 සමාජ ආර්ථික බලපෑම** | |
| **7.2.4.1 ආපදා අවදානම අවම කිරීමේ ප්‍රදේශය තුළ කෘෂිකර්මාන්තයට සිදුවන බලපෑම්**<br>මෙම ප්‍රදේශය තුළ කෘෂිකාර්මික කටයුතු සිදු නොවන බැවින්, ඒ පිලිබඳ සලකා බැලීමක් අවශ්‍ය නොවේ. | **නොවැදගත්** |
| **7.2.4.2 කම්පන බලපෑම් හේතුවෙන් ගොඩනැගිලි වල ඇතිවන ඉරිතැලීම්**<br>මෙම ප්‍රදේශය තුළ කිසිදු ගොඩනැගිල්ලක් නොපවතින බැවින්, ඒ පිලිබඳ සලකා බැලීමක් අවශ්‍ය නොවේ. | **නොවැදගත්** |
| **7.2.4.3 ඉඩම් සහ යටිතල පහසුකම් සඳහා ලඟාවීමේ අවහිරතා**<br>බොහෝ ඉදිකිරීම් කටයුතු ඇල්ල - වැල්ලවාය (A23) මාර්ගයට යාබද අස්ථායී බෑවුම් ප්‍රදේශයේ සිදු කරනු ඇත. එබැවින් ඉදිකිරීම් අදියරේදී මෙම මාර්ගය තාවකාලිකව අවහිර වනු ඇත. | **වැදගත්** |
| **7.2.4.4 ජීවනෝපාය මාර්ගයන්ට හා ආදායම් ජනනය වන ක්‍රියාකාරකම් වලට සිදුවන බලපෑම**<br>මෙම අවම කිරීමේ ස්ථානය තුළ දැනට ජීවනෝපාය/ව්‍යාපාර සහ ආදායම් ක්‍රියාකාරකම් කිසිවක් නොමැත. | **වැදගත්** |
| **7.2.4.5 සේවා සැපයීම කෙරෙහි වන බලපෑම් (ජල සැපයුම, අපජලය, විදුලිය)**<br>මෙහි විදුලිය, ජල සැපයුම් මාර්ග සහ මලාපවහන මාර්ගවලට බලපෑමක් සිදු නොවේ. | **වැදගත්** |
| **7.2.4.6 ඉදිකිරීම් අතරතුර පිටස්තර පුද්ගලයින් පිවිසීමේ අවදානම**<br>මිනිසුන් සහ පදිකයින් මෙම පරිශ්‍රය හරහා ගමන් කරන අතර ඉදිකිරීම් කටයුතු සඳහා කැණීම් යන්ත්‍රෝපකරණ, ලෝඩර්, ට්‍රක් රථ ආදිය භාවිතා කෙරේ. ඇතැම් යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ස්ථානය තුල අධි වෝල්ටීයතා විදුලිබලය භාවිතා කළ හැක. නුසුදුසු ගබඩා කිරීම සහ හැසිරවීමේ අක්‍රමිකතා නිසා හානිකර ලෝහ එකතු කිරීම් වන වානේ වැනි ද්‍රව්‍ය භාවිතා කළ හැකිය. යෝජිත අවමකරණ ස්ථානය ඇල්ල - වැල්ලවාය (A23) මාර්ගයේ පිහිටා ඇති බැවින්, මිනිසුන් ඇතුළුවීම පිළිබඳ නොදැනුවත්කම සහ යන්ත්‍රෝපකරණ නොසැලකිලිමත් ලෙස ක්‍රියාත්මක කිරීම නිසා පුද්ගලයින්ට මාරාන්තික තුවාල හා අනතුරු ඇති කළ හැකිය. | **වැදගත්** |
| **7.2.4.7 කඳවුරු භූමිය සහ අනෙකුත් අවශ්‍යතා**<br>කඳවුරු භූමිය අසල්වැසි ප්‍රදේශයෙන් තෝරා ගනු ලැබේ. නිසි කඳවුරු කළමනාකරණයක් ක්‍රියාත්මක නොවන්නේ නම් කම්කරු ප්‍රශ්න, ප්‍රජාව සමඟ සමාජ ගැටළු, සම්පත් බෙදාගැනීමේ ගැටුම්, සහ අපද්‍රව්‍ය කළමනාකරණය යනාදී ගැටළු ඇතිවිය හැකිය. මෙම ස්ථානය වනජීවී සංරක්ෂණ ප්‍රදේශයට ඉතා ආසන්නව පිහිටා ඇති බැවින් තාවකාලික කඳවුරු, වැඩබිමට ආසන්නයේ ඉදිකරන්නේ නම්, ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය හා මලාපවහනය ගැටළුවක් වනු ඇත. තවද, මෙම පරිශ්‍රයේ සිට සේවකයන්ට අවශ්‍ය ජලය සහ අනෙකුත් පහසුකම් සැපයා ගැනීම සඳහා අදාළ පාර්ශ්වයන්ගෙන් අවසර ලබාගත යුතුය. | **වැදගත්** |

| | |
|---|---|
| **7.2.4.8 වැඩබිම් ශ්‍රමිකයින් හා ප්‍රජාව අතර සම්බන්ධතා සහ ගැටුම් ඇතිවීම**<br>වැඩබිම සඳහා යොදා ගනු ලබන ශ්‍රමිකයින් විවිධ ප්‍රදේශ සහ සමාජ පරිසරවලින් පැමිණෙන්නන් වන අතර, ඔවුන් සාමාන්‍යයෙන් අඩු අධ්‍යාපන මට්ටමක් සහ දරිද්‍රතාවෙන් පෙළෙන සමාජ පසුබිමක් සහිත වූවන් වේ. ඒ අනුව අවමකරණ ස්ථානයට යාබදව නේවාසික හා වාණිජමය කටයුතු පවතින බැවින් ඉදිකිරීම් භූමියේ කම්කරුවන් සහ ගම්වාසීන් අතර යම් යම් ආරවුල් ඇතිවීමේ ඉහළ හැකියාවක් පැවතිය හැක.<br><br>තවද, මෙම කලාපය ආකර්ෂණීය සංචාරක ස්ථානයක පිහිටා ඇති අතර දේශීය හා විදේශීය සංචාරකයින්ගේ දර්ශනයට බාධාවක් වන්නේ ද යන්න සලකා බැලිය යුතුය. ඉදිකිරීම් භූමියේ තත්ත්වය පිළිබඳව දේශීය සංචාරකයින්ට පැහැදිලි අවබෝධයක් තිබිය හැකි නමුත් විදේශිකයන්ට එලෙස අවබෝධයක් නොපවතින නිසා ආරවුල් මගහරවා ගැනීමට / විසඳීමට අදාළ නිලධාරීන් වගකීම් භාර ගත යුතුය. | **ඉතා වැදගත්** |
| **7.2.4.9 ඉදිකිරීම් අතරතුර ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව**<br><br>වැඩබිම් ශ්‍රමිකයින් වැටීම් නිසා සිදුවන අනතුරු වලට නිරාවරණය වීමේ වැඩි ප්‍රවණතාවක් ඇත. ඉතා සීමිත ඉඩකඩක් තුළ ඉදිකිරීම් යන්ත්‍ර භාවිත කිරීම නිසා මෙම වැඩබිම තුළ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ රථවාහන අනතුරු ඇති වීමේ ඉහළ අවදානමක් පවතී. කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් සඳහා ළමා ශ්‍රමිකයින් යොදා ගතහොත් එය දැඩි අවදානම්කාරී හා අනතුරුදායී කටයුත්තක් බවට පත්වේ. | **වැදගත්** |
| **7.2.4.10 වැඩබිමට ඇතුළු වන හෝ ඒ හරහා ගමන් කරන ප්‍රජාවට වන බලපෑම**<br><br>ඇල්ල - වැල්ලවාය (A23) මාර්ගයට යාබදව මෙම අවමකරණ ස්ථානය පිහිටා ඇති බැවින් ඉදිකිරීම් අතරතුර එම ස්ථානයට ඇතුළුවීම හෝ පිටවීම සම්බන්ධයෙන් ගැටළුවක් ඇතිවේ. | **වැදගත්** |

## 8. සැලකිය යුතු පාරිසරික සහ සමාජීය බලපෑම්

NBRO හි විශේෂ අවධානයක් යොමුවන පාරිසරික, සමජයීය බලපෑම් හෝ අවදානම් පහත පරිදි දැක්විය හැක.

### 8.1. මූලික සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු: කොන්ත්‍රාත්කරුවන් සඳහා සම්මත ගිවිසුම් අවශ්‍යතාවන්ට අමතරව විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂණ නිර්දේශයන්

බෑවුම් කඩා වැටීමේ අවදානමක් සහිත අස්ථායී බෑවුමකට ආසන්නව ශ්‍රමිකයින්ට වැඩ කිරීමට සිදු වන බැවින් මෙම වැඩබිමට අදාළව සෞඛ්‍ය සහ ආරක්ෂිත ගැටළු පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුවේ. එබැවින් එකී පොදු සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටලු ESMF හිදී අවධානයට ලක්කර ඇත. ඉදිකිරීම් වැඩබිම්වලදී ශ්‍රමිකයින්ගේ ආරක්ෂණ අවශ්‍යතා පිළිබඳ ව 2003 දරණ සේවා කොන්දේසි, ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධ නිර්දේශ දක්වන ලංසු ලේඛනයේ 2003(5) වගන්තිය යටතේ ආරක්ෂිත උපාංග සහ පැළඳුම් පිළිබඳව සවිස්තරාත්මකව දක්වා ඇත.

### 8.2 ළමා හා බලහත්කාර ශ්‍රමය

2003 දරණ සේවා කොන්දේසි, ප්‍රජා සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ නිර්දේශ දක්වන ලංසු ලේඛනයේ 2003.3 වගන්තිය යටතේ ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය පිළිබඳ සවිස්තරාත්මකව දක්වා ඇත.

## 9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව

මෙම කොටස යටතේ පෙර (7) හා (8) අංශ වලදී හඳුනාගන්න ලද බලපෑම් සහ අවදානම් කළමනාකරණය හෝ අවමකරණය සඳහා අවශ්‍ය පාරිසරික හා සමාජීයීය පියවර හා නිශ්චිත

නිර්දේශයන් ඉදිකිරීම් ක්‍රියාවලියේ ප්‍රධාන අදියරයන් වන සැලසුම් අදියර, ඉදිකිරීම් අදියර සහ නඩත්තු මෙහෙයුම් අදියර යටතේ අන්තර්ගතකර ඇත.

**9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම**

මෙම ආපදා අවදානම් අවමකරණ ස්ථානය තුළ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියක අවශ්‍යතාවක් නොපවතින අතර ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේදී බර යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීමේදී ඇතිවන භූ කම්පනය හේතුවෙන් ප්‍රධාන මාර්ගයට යම් යම් ව්‍යුහාත්මක හානි සිදුවිය හැක.තවද ව්‍යාපෘතිය හේතුවෙන් ගොඩනැගිලි වල ව්‍යුහයන්ට හානි සිදුවුවහොත් වන්දි ගෙවීමේ ක්‍රියාවලියක් සකස් කළ යුතු අතර (පරිශීලනය (2002.2.17)) උපයෝගිතා සේවා සහ අනෙකුත් පහසුකම් පිලිබඳව ESMP හරහා අවධානය යොමුලකළ යුතුවේ.

**9.2 තාවකාලිකව ඉවත් කිරීම**

මෙම ආපදා අවදානම් අවමකරණ ස්ථානය තුළ තාවකාලිකව ඉවත් කිරීමේ ක්‍රියාවලියක අවශ්‍යතාවක් නොපවතින අතර පහත බෑවුම් (ඇල්ල-වැල්ලවාය මාර්ගයේ කොටසක්) ප්‍රදේශය ඉදිකිරීම් කාලය සඳහා "ඇතුල්වීම් තහනම් කලාපයක්" ලෙස නම් කළ යුතුය. පොදු දේපල වලට ඇති අවදානම අවම කිරීම සඳහා, අවම කිරීමේ ස්ථානය ඉදිරිපිට, මාර්ගය දෙපස වාහනය නවතා තැබීමට ඉඩ නොදීම වඩාත් සුදුසුය.

**9.3 හානියට පත් ඉදිකිරීම් ව්‍යුහයන් ඉවත් කිරීම (අබලි ද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව ඉඩම් හිමිකරුවන්ගේ නිර්දේශ ලබා ගැනීම)**

ආපදා අවමකරණ ප්‍රදේශය තුල හානියට පත් ඉදිකිරීම් ව්‍යුහයන් ඉවත් කිරීම හෝ අබලි ද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධ අවදානමක් නොපවතී. නමුත්, ඇල්ල-වැල්ලවාය මාර්ගයේ මෙම අවමකරණ ස්ථානය ඉදිරිපස විශාල පාෂාණයක් තැන්පත් වී ඇති බැවින් මෙම ව්‍යාපෘතිය සිදුකරගෙන යාමේදී එය ඉවත් කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය හා සහය ලබා ගත යුතුයි.

**9.4 ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් දේපළ හා භාවිතයන් අහිමි වීම වෙනුවෙන් වන්දි ගෙවීම**

ඉදිකිරීම් වලදී යටිතල පහසුකම්වලට හෝ මාර්ගයේ වෙනත් කිසියම් අංගයකට යම් හානියක් සිදුවුවහොත් වන්දි ගෙවිය යුතුයි.

**9.5 මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය - පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වේ**

විශේෂයෙන් නාය යෑම් හේතුවෙන් ඇති විය හැකි අවදානම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකළ යුතුය.

**9.6 පිරිසැලසුම් පදනම් කරගත් පාරිසරික/සමාජයීය කළමනාකරණය**

මෙම වැඩබිමෙහි පාරිසරික හා සමාජයීය සාධක මත පදනම්ව පහත සඳහන් පාරිසරික හා සමාජයීය පිරිසැලසුම් යෝජනා නිර්දේශ කරනු ලැබේ.

*වගුව 2: පිරිසැලසුම් අදියරයේදී පාරිසරික සමාජයීය නිර්දේශ*

| පිරිසැලසුම් අවස්ථා | මෙම වැඩබිම සඳහා සලකා බැලිය යුතු මට්ටම |
|---|---|
| i. **ස්වභාවික සම්පත් කළමනාකරණය සහ සම්පත් උපරිම උපයෝජනය කිරීමේ සැලසුම්**<br>ව්‍යාපෘති පිරිසැලසුම්කරණයේදී එම භූමියේ ඇති වෘක්ෂලතාදිය ඉවත් කිරීම වැලැක්වීමට හෝ අවම වශයෙන් ඉවත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. එසේම විශේෂිත හෝ ආවේණික ශාක හඳුනාගතහොත් එවැනි ශාක සංරක්ෂණය කිරීමට විශේෂ අවධානයක් යොමු කළ යුතුය.වනජීවී සංරක්ෂණ | ඉහළයි |

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රකාශය අනුව "ඕනෑම රජයේ ඉඩමක කිසියම් ශාකයක් කැපීම, එකතු කිරීම, හානි කිරීම හෝ ඉවත් කිරීම, කිසියම් ගොඩනැඟිල්ලක් හෝ මාර්ගයක් ඉදිකිරීම, පිරිසිදු කිරීම, වගා කිරීම, පතල් කැණීම, පිරවීම, කසළ බැහැර කිරීම තහනම් වේ". එබැවින්, සලකා බැලීමේ මට්ටමද ඉහළ විය යුතුය. | |
| ii. **වැඩබිම් සැලසුම්කරණය**<br>ඇල්ල - වැල්ලවාය (A23) ප්‍රධාන මාර්ගයේ නායයෑම් අවධානම අවම විය යුතු බැවින්, වැඩබිම සැලසුම් කිරීමේදී නාය යෑම් නැවත සක්‍රීය වීම හැකියාවක් පවතීද යන්න සහ සුන්බුන් ජනනය වීමේ හැකියාවක් පවතීද යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතුය. | ඉහළයි |
| iii. **වාසස්ථාන සහ සතුන්ගේ ගමන් මාර්ග**<br>ස්ථිර ව්‍යුහ, ප්‍රවේශ මාර්ග වැනි යම් ඉදිකිරීමක් හේතුවෙන් විශාල ප්‍රදේශයක වන ව්‍යාප්තිය ඉවත් කිරීමට සිදු වන්නේ නම් සහ ඒ හේතුවෙන් සතුන්ගේ වාසස්ථාන හා ගමන් මාර්ග තහ් ජලාපවහන මාර්ග වලට හෝ අවහිරයක් වන්නේ නම්, එහි බලපෑම සීමිත ප්‍රදේශයකට වුවත් ඒ සඳහා සත්ව මංපෙත්, තීරු ක්‍රමයට ශාක සිටුවීම් ආදී යෝග්‍ය ක්‍රම අනුගමනය කළ යුතුයි. | ඉහළයි |
| iv. **ජල සම්පත් සංරක්ෂණය**<br>අවදානම් අවමකරණ පියවරක් වශයෙන් මෙම මෙම භූමියෙන් භූගත ජලය ඉවත් කරන්නේ නම් සහ එම ජලය ප්‍රමාණාත්මකභාවයෙන් හා ගුණාත්මකභායෙන් ඉහළ නම්, එය ගෙවතු වගාවන් සඳහාත්, සනීපාරක්ෂක කටයුතු සඳහාත් ජල මූලාශ්‍රයක් ලෙස සැලකිය හැකිය. තවද යෝජිත අවම කිරීමේ ස්ථානයට ආසන්නව පූතිගත ටැංකියක් පිහිටා ඇති බැවින් ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය. | මධ්‍යස්ථයි |
| v. **සංවර්ධන විභවයන් උපයෝගී කර ගැනීමේ අවස්ථා සලකා බැලීම**<br>අවදානම් අවමකරණ ස්ථානය දේශීය හා විදේශීය සංචාරක ආකර්ශනීය ස්ථානයක පිහිටා ඇත. එබැවින්, මෙම පරිශ්‍රයේ පවතින සංවර්ධන විභවතාවයන් උපයෝගී කර ගැනීම සඳහා පිරි සැලසුම් කිරීමේදී සැලකිය යුතු අවධානයක් යොමු කළ යුතුය. මෙම අඩවිය සඳහා සංකල්පීය සැලසුම ඇමුණුම (II) හි අමුණා ඇත. | ඉතා ඉහළයි |
| vi. **ජල සැපයුමට බාධා ඇතිවීම**<br>මෙම යෝජිත අවමකරණ ස්ථානය හරහා ජල සැපයුම් මාර්ගයක් ගමන් නොකරයි. | පහළයි |
| vii. **සෞන්දර්යාත්මක නිර්මාණ සලකා බැලීම්**<br>සෞන්දර්යාත්මක සංවේදී පරිසර වලට ගැලපෙන පරිදි සැලසුම් කිරීමේදී, දෘශ්‍ය දූෂණය අවම මට්ටමක තබා ගැනීම සඳහා ස්වභාවික පරිසරය සමඟ මුසු වන ව්‍යුහයන් පිළිබඳ වැඩි අවධානයක් යොමුකළ යුතුය. එහිදී එම පරිසරයට වඩාත් ගැලපෙන අවම කිරීමේ ව්‍යුහයන් සැලසුම් කිරීම සඳහා භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සේවය ලබා ගත හැක. | ඉහළයි |
| viii. **හරිත පාරිසරික ලක්ෂණ පිළිබඳ සලකා බැලීම**<br>අවමකරණ ක්‍රියාමාර්ග බොහොමයක් හොඳින් නඩත්තු කරන ලද පරිශ්‍රයන්හි සිදු කෙරෙන බැවින්, පිරි සැලසුම් වලදී හැකිතාක් හරිත පාරිසරික ක්‍රමවේද හා බැඳුණු අවදානම් අවමකරණ පියවරයන් සලකා බැලීමට නිර්දේශ කෙරේ. උදා. ඛාදනය පාලනය කිරීම සඳහා දේශීය ශාක භාවිතා කිරීම, පරිසරයේ ජෛව විවිධත්වය පවත්වාහගැනීම සඳහා ශාක සයෝජනය කිරීම, ආක්‍රමණික විශේෂ ඇතුල්වීම වැලැක්වීම | ඉහළයි |

| | |
|---|---|
| ix. **ශ්‍රමිකයින්ගේ/ මගීන්ගේ සහ ප්‍රජාවගේ ආරක්ෂාව**<br><br>ඉදිකිරීම් අතරතුර බෑවුම් අස්ථාවර වීම් සිදුවිය හැකි බැවින් වැඩබිම් ශ්‍රමිකයින්ට හා සංචාරකයින්ට අවදානමක් පවතී. ඒ අනුව සංචාරකයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් ආරක්ෂිත තැනි (Berms) ආරක්ෂිත දැල් (Safety nets) සහ ආරක්ෂිත වැටවල් (Safty Fence) වැනි ආරක්ෂිත ක්‍රමවේදයන් පිළිබඳ පිරිසැලසුම්කරණයේදී අවධානය යොමු කළ යුතු ය. | ඉතා ඉහළයි |
| x. **පාංශු ඛාදන වැළැක්වීමේ ව්‍යුහයන්**<br><br>වැසි කාලයේදී ජලාපවහන පද්ධති හරහා ජලය ගලායාම සැලකිය යුතු මට්ටමක පවතින අතර අස්ථායී බෑවුම් මතුපිට හරහාද වැහි ජලය ගලායාමක් අපේක්ෂා කළ හැකිය. එබැවින්,ඒ හරහා ගලාඑන ජලය ජලාපවහන පද්ධතියක් හරහා පිටතට ගෙන යා යුතුයි. එබැවින් බෑවුම්වල සිදුවන ඛාදනය අවම කිරීමට පිරිසැලසුමේදී ප්‍රවාහ වේගය අවම කිරීමේ ක්‍රම පිළිබඳ සලකා බැලිය යුතුය. | ඉහළයි |
| xi. **අවම පශ්චාත් නඩත්තු සහ මෙහෙයුම් පිරිසැලසුම්**<br><br>අවමකරණ ක්‍රියාමාර්ග වලදී ජල කළමනාකරණය සඳහා ගුරුත්වාකර්ෂණ ජලාපවහන පද්ධතින් වැනි ක්‍රම පිළිබඳ සලකා බැලිය යුතුය. ජලාපවහන පද්ධති අවහිර වීම වැළැක්වීමට නළ විෂ්කම්භය, සිදුරු විෂ්කම්භය සහ තැබීමේ කෝණ ආදිය නිවැරදිව පැවතිය යුතුය. ජල පරිවහන කාණු ඍජුව ස්වභාවික ජල මාර්ගයන්ට යොමු වන්නේ නම් රොන්මඩ තැන්පතු වැනි පාංශු ඛාදන වැළැක්වීම සඳහා අවම නඩත්තු පිරිවැයක් සහිත පිරිසැලසුම් සහ ව්‍යුහයන් හඳුන්වා දිය යුතු ය. මෙම ව්‍යුහයන් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය කල්පැවැත්ම සහ කාලගුණික තත්වයන්ට ඔරොත්තු දෙන පරිදි ප්‍රවේශමෙන් තෝරා ගත යුතුය. තවද පිරිසැලසුම්කරණයේදී ඛාදන වැළැක්වීමේ සහ අවම නඩත්තු පිරිවැයක් සහිත ක්‍රමවේද පිළිබඳ වැඩි අවධානය යොමු කළ යුතුය. | ඉහළයි |

## 9.7 ඉදිකිරීම් ක්‍රියාවලිය තුළ සිදුවන බලපෑම් අවම කිරීම

### 9.7.1 ඉදිකිරීම් අදියර තුළ පාරිසරික හා සමාජයීය කළමනාකරණය සඳහා කොන්ත්‍රාත්කරුගේ අනුකූලතාව

පාරිසරික හා සමාජීය බලපෑම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා ගනු ලබන පියවර සාමාන්‍යයෙන් සියලු නායයෑම් අවදානම් අවමකිරීමේ ස්ථාන වලට පොදු වේ. එසේම එවැනි බලපෑම් බොහෝ දුරට ඉදිකිරීම් සඳහා බලපෑම් එල්ල කරන බැවින් බලපෑම් අවම කිරීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු කටයුතු කළ යුතු වේ. මේ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉදිකිරීම් අදියරයේදී පාරිසරික හා සමාජයීය සෞඛ්‍ය හා ආරක්ෂාව (E & HS) කළමනාකරණයට අනුකූල වීම සඳහා "කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය" පිළිබඳ පුළුල් ලේඛනයක් සකස් කර ඇත. එම ලේඛනයෙහි මෙම ස්ථානයට අදාළ ප්‍රධාන කොටස් සහ එහි අදාලත්වය පිළිබඳ පහත වගුවේ දැක්වේ.(වගුව 3). එය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුගේ ලංසු ලේඛනයේ ඉදිරිපත් කළ යුතුය.

වගුව 3: ES & HS කළමනාකරණයට අනුකූල වීම සඳහා "කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය"

| ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට අනුව ESMP යොමු අංකය | සංරචකය | ව්‍යාපෘතියට අදාළත්වය |
|---|---|---|
| **2002. පාරිසරික හා සමාජයීය අධීක්ෂණය** | | |
| 2002.2 1) | වැඩබිම තුළ ගබඩා කිරීම් | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 2) | ශබ්දය හා කම්පන | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 3) | ඉරිතැලීම් සහ ගොඩනැගිලිවලට සිදුවන හානි | අදාළ වේ (ආසන්න නිවාස) |

| | | |
|---|---|---|
| 2002.2 4) | අපද්‍රව්‍ය බැහැර කිරීම | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 5) | අබලි ද්‍රව්‍ය බැහැර කිරීම | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 6) | දුහුවිලි පාලනය | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 7) | ඉදිකිරීම් ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය ප්‍රවාහනය | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 8) | ජලය | අදාළ වේ |
| 2002.2 9) | ශාක හා සත්ත්ව විශේෂ | සුලු වශයෙන් අදාළ වේ |
| 2002.2 10) | භෞතික හා සංස්කෘතික සම්පත් | සුලු වශයෙන් අදාළ වේ |
| 2002.2 11) | පාංශු ඛාදනය | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 12) | පාංශු දූෂණය | අදාළ වේ |
| 2002.2 13) | පස් හා වැලි ලබා ගැනීම | අදාළ වේ |
| 2002.2 14) | පාෂාණ ලබා ගැනීමේ ක්‍රියාවලි | අදාළ වේ |
| 2002.2 15) | නඩත්තු වාහන සහ යන්ත්‍ර | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 16) | මහජනතාවට සිදුවන අවහිරතා | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 17) | පොදු පහසුකම් සහ යටිතල පහසුකම් | අදාළ වේ |
| 2002.2 18) | පරිසර අලංකරණය | අදාළ වේ |
| **2002-5. පාරිසරික අධීක්ෂණය** | මූලික සමීක්ෂණය (වායු, ජලය, ශබ්දය, කම්පන, ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ) | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | ඉදිකිරීම් සිදුකරන අතරතුර සමීක්ෂණ (වායු, ජලය, ශබ්දය, කම්පන, ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ) | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | මෙහෙයුම් කාලසීමාව තුළ සමීක්ෂණ | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | වාර්තා පවත්වාගෙන යාම | අදාළ වේ |
| **2003. සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය සහ ආරක්ෂාව** | | |
| 2003.2 | ආරක්ෂාව පිළිබඳ සංවිධානකරණය සහ සන්නිවේදනය | බෙහෙවින් අදාළ වේ |
| 2003.4 | ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය | බෙහෙවින් අදාළ වේ |
| 2003.5 | ආරක්ෂාව පිළිබඳ වාර්තා සහ අනතුරු දැනුම් දීම | බෙහෙවින් අදාළ වේ |
| 2003.6 | ආරක්ෂිත උපකරණ සහ ඇඳුම් | බෙහෙවින් අදාළ වේ |
| 2003.7 | ආරක්ෂාව පිළිබඳ නිරීක්ෂණය | බෙහෙවින් අදාළ වේ |
| 2003.8 | ප්‍රථමාධාර පහසුකම්. | බෙහෙවින් අදාළ වේ |
| 2003.9 | සෞඛ්‍ය සහ ආරක්ෂිත තොරතුරු සහ පුහුණුව | බෙහෙවින් අදාළ වේ |
| | පැල උපකරණ සහ සුදුසුකම් ලත් පිරිස් | බෙහෙවින් අදාළ වේ |

**අදාළ වේ:** සෑම ව්‍යාපෘති වැඩබිමකටම අදාළව භාවිත කළ යුතු පොදු ESMP ලෙස මෙම කොටසින් දැක්වේ.
**බෙහෙවින් අදාළ වේ:** ආපදා අවදානම අවමකරණ ස්ථානයට අදාළව සකස් කරන ලද ESMP ට අනුකූල වන පරිදි පාරිසරික ප්‍රමිතීන් සකස් කිරීමට කොන්ත්‍රාත්කරු විසින් දැඩි අවධානයක් යොමු කළ යුතුය.
**අදාළ විය හැකි:** ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කාලසීමාව ESMP හි පූර්ණ අවශ්‍යතා සඳහා මෙය අදාළ විය හැකිය.
**අදාළ නොවේ:** ස්ථානයේ ස්වභාවය මත මෙම කොටස් අදාළ නොවිය හැකිය.
**වෛකල්පිත:** අවශ්‍යතාවකදී භාවිත කළ හැකිය.
**ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම:** මෙම සැලැස්ම තුළ පවත්නා අධීක්ෂණ කටයුතු සිදු කිරීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.
**පරිශීලනය කරන්න:** ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත්කරුගේ වගකීම

## 9.7.2 ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණය

ඉදිකිරීම් කාලයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණ පියවර පහත දැක්වේ.

*වගුව 4 : ස්ථානීය විශේෂිත ES & HS අවමකරණ පියවරයන්*

| අවදානම් අවමකිරීමේ සංරචක | ව්‍යාපෘති අදියර | වගකීම |
|---|---|---|
| i. **ඉදිකිරීම් ක්‍රියාවලිය අතරතුර සිදුවන ඛාදනය වීමේ බලපෑම් අවම කිරීම**<br><br>අවම කිරීමේ ස්ථානය බෑවුම් සහිත ප්‍රදේශයක පිහිටා ඇති බැවින්, වර්ෂා කාල සීමාවන්හිදී වැඩබිම එළි පෙහෙළි කිරීම, බෑවුම නැවත සකස් කිරීම සහ සුන්බුන් ඉවත් කිරීම වැනි කාර්යන්වල නොයෙදීම දැඩිව නිර්දේශ කෙරේ. එබැවින් ඉහළ බෑවුමේ අවදානම් අවමකරණ කටයුතු වියලි කාල සීමාවන්හිදී පමණක් සිදු කිරීමට සහ වර්ෂා කාල සීමාවන්හිදී අස්ථායී බෑවුමේ එවැනි කටයුතු සිදු නොකිරීමට දැඩිව නිර්දේශ කෙරේ. මේ පිළිබඳව ව්‍යාපෘතිය සැලසුම් අදියරයේදී අවධානය යොමු කළ යුතුය. තවද බෑවුම සකස් කිරීමේදී ඇති වූ සුන්බුන් හේතුවෙන් කාණු පද්ධති පිරී යාම වැළැක්වීමට රොන්මඩ තැන්පතු හඳුන්වා දිය යුතු ය. | භූමිය සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| ii. **ව්‍යාපෘති ක්‍රියාකාරකම් සැලසුම් කිරීම**<br><br>කොන්ත්‍රාත්කරු ඇල්ල - වැල්ලවාය (A23) මාර්ගය දෙපස අවම කිරීමේ ක්‍රියා සිදු කළ යුතු බැවින්, පරිශ්‍රය තුළ ඉදිකිරීම් කටයුතු කළමනාකරණය කිරීම සඳහා මනා සැලැස්මක් ප්‍රවේශමෙන් සකස් කළ යුතුය.එම සැලැස්ම තුළ වැඩබිමෙහි ඉඩ පහසුකම් උපරිමයෙන් උපයෝජනය වන හා ආරක්ෂාව උපරිම වන පරිදි ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම, රථ වාහන නැවැත්වීම, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම සහ පිරිසිදු කිරීම වැනි දෑ සඳහා තෝරා ගැනීම් කළ යුතුය. | භූමිය සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| iii. **ඇතුළු නොවන කලාපය**<br><br>ඉදිකිරීම් අදියරේදී මෙම ස්ථානයේ බෑවුම් අස්ථාවර වීමේ අවදානම පිළිබඳව PMU විසින් සවිස්තරාත්මක තක්සේරුවක් සිදු කරමින් 'ඇතුළු නොවන කලාපයක්" ප්‍රකාශ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.<br>එසේම වාහන ධාවනයේදී සිදුවන අනතුරු, යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමේදී සිදුවන අනතුරු හා විදුලි කාන්දුවීම් ආදිය අවම කිරීම සඳහා සෞඛ්‍ය හා ආරක්ෂණ කළමනාකරණ සැලැස්ම තුල ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය. තවද බෑවුමේ අස්ථායීතා අවදානම දැක්වෙන සංඥා පුවරු මෙම ප්‍රදේශයේ ප්‍රදර්ශනය කිරීමට දැඩි ලෙස නිර්දේශ කෙරේ. | ඉදිකිරීම් අදියර | PMU හි E & S ඒකකය<br>කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| iv. **යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍ය ප්‍රවාහනය**<br><br>ඉදිකිරීම් අදියරේදී යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය සහ වාහන ප්‍රවාහනය සඳහා ඇල්ල - වැල්ලවාය (A23) මාර්ගය භාවිතා කිරීමට සිදුවේ. එබැවින් සිදුවිය හැකි අනතුරු හා මාර්ගයට සිදුවන හානි වැඩි බැවින් දැඩි අවධානයෙන් සිටිය යුතුය.එසේම, සංචාරකයින්ගේ පහසුව තකා මෙම මාර්ගයේ අවමකරණ ස්ථානයට යාබදව පවතින ඉහළ දර්ශන තල අසල විකල්ප වාහන නැවැත්වීමේ පහසුකම් සකස් කළ යුතුය. | ඉදිකිරීම් අදියර | PMU හි E & S ඒකකය<br>කොන්ත්‍රාත්කරු |
| v. **ශබ්දය හා කම්පන පාලනය**<br><br>ඇල්ල අභයභූමිය ආශ්‍රිත ප්‍රදේශයේ වෙසෙන කෘමීන්ගේ, පක්ෂීන්ගේ සහ සතුන්ගේ ක්‍රියාකාරකම් මෙන්ම එම ස්ථානය පසුකර යන සංචාරකයින් සහ මගීන්ගේ ක්‍රියාකාරකම් නිසි පරිදි පවත්වාගෙන යාමට මෙම ව්‍යාපෘතියේ බලපෑමෙන් ඇතිවන ශබ්ද සහ කම්පන උත්පාදන ක්‍රියාවන් බාධාවක් විය හැක. | ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| vi. **ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම**<br><br>මෙම ආපදා අවමකරණ ස්ථානය තුළ ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීමේදී කොන්ත්‍රාත්කරු විශේෂ අවධානයක් යොමු කළ යුතුය. එබැවින් අපද්‍රව්‍ය ජනනය වන්නේ නම් ඒවා වැඩබිම තුළ බැහැර නොකළ යුතු අතර වැඩබිම තුළ විධිමත්ව ගබඩා කර PMU විසින් අනුමත කරනු ලබන ක්‍රමවේදයක් හරහා ඒවා බැහැර කළ යුතුය.තවද, ඉදිකිරීම් අපද්‍රව්‍ය මෙම පරිශ්‍රය තුළ හෝ අවම කිරීමේ ස්ථානයට ආසන්න වෙනත් ස්ථානයකට බැහැර නොකළ යුතුය. | වැඩබිම සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| vii. **දුහුවිලි සහ වායු දූෂණය පාලනය කිරීම**<br><br>ඉදිකිරීම් කාලය තුළ ජනනය වන දූවිලි අංශු යාබද වනජීවී වාසස්ථාන වලට, මගීන්ට සහ සංචාරකයින්ට බලපෑම් ඇති කළ හැකිය. අධික දූවිලි හෝ (aerosol) ජනනය කිරීමේ ක්‍රියාකාරකම් අපේක්ෂා කරන්නේ නම් විශේෂ තිර භාවිතා කළ යුතුය. | වැඩබිම සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| viii. **ඉදිකිරීම් සඳහා ජලය හා විදුලිය**<br><br>ඉදිකිරීම් කටයුතු සඳහා අනුමත ස්ථානවලින් ජලය ලබා ගත යුතුය. කොන්ත්‍රාත්කරු විසින් කිරිඳි ඔයෙන් හෝ ඉහළ බෑවුම් ප්‍රදේශයේ උල්පතෙන් ජලය භාවිතා කිරීමට අදහස් කරන්නේ නම්, ඒ පිළිබඳව දැනුවත් කර අවශ්‍ය අවසරය ලබා ගත යුතුය.<br><br>තවද එම ස්ථානය හරහා විදුලි රැහැන් ගමන් නොකරන බැවින් අවමකරණ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට පෙර අදාළ බලධාරින්න්ගේ අනුමැතිය ලබා ගත යුතු අතර නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුයි. | ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| ix. **සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු**<br><br>මෙම ස්ථනයේ සේවකයින්ට ඉහළ අවදානම් තත්වයන් යටතේ කටයුතු කිරීමට සිදු වන බැවින්, ESMP හි කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම් දක්වන 2003 දරණ සේවා "කොන්දේසි, ප්‍රජා සෞඛ්‍ය සහ ආරක්ෂාව" වගන්තිය යටතේ දක්වා ඇති නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, මෙම නිර්දේශයන් සංවිධානාත්මක ආරක්ෂක අධීක්ෂණ පද්ධතියක් තුළ අනුගමනය කළ යුතුයි.<br><br>• මීට අමතරව, වැසි සමයේදී අස්ථායී බෑවුම්වල ඉදිකිරීම් කටයුතු වල නිරත වීම ඉතා අවදානම් සහිත බැවින් වැසි කාලවලදී ප්‍රමාණවත් කාලයක් සඳහා ඉදිකිරීම් කටයුතු නතර කළ යුතුය.<br>• සේවකයාගේ සහ මහජනයාගේ ආරක්ෂාව සඳහා මෙම ස්ථානය සඳහා හොඳ අනතුරු ඇඟවීමේ පද්ධතියක් සහ පූර්ණ කාලීන මුරකරුවන් නිර්දේශ කෙරේ.<br>• පාෂාණ කඩා වැටීමේ අවදානමෙන් කම්කරුවන් සහ ප්‍රජාව ආරක්ෂා කිරීම සඳහා අවදානම් ස්ථානවල ආරක්ෂිත බාධක සහ ආරක්ෂිත දැල් සවි කළ යුතුය.<br>• වෙනත් අනතුරු සඳහා නිසි හදිසි කළමනාකරණ ඒකකයක් (ප්‍රථමාධාර පහසුකම්, ආරක්ෂිත ද්‍රව්‍ය, රෝහල්ගත කිරීමේ පහසුකම් සහ ප්‍රවාහන පහසුකම්) මෙම අඩවිය සඳහා පවත්වාගෙන යා යුතුය. | ඉදිකිරීම් අදියර | PMU හි E & S ඒකකය<br>කොන්ත්‍රාත්කරු |
| x. **ආරක්ෂිත ව්‍යුහයන් / සංඥා පුවරු**<br><br>ඉදිකිරීම් අදියරේදී ඉහළ බෑවුම් ප්‍රදේශවලින් කම්කරුවන් බිම පතිත වීමේ අවදානම වැළැක්වීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂිත වැටවල් ස්ථාපිත කළ යුතුය. අස්ථායී බෑවුම් ප්‍රදේශයේ බෑවුමේ අස්ථායීතා අවදානම දැක්වෙන අනතුරු ඇඟවීමේ පුවරු තැබිය යුතුය. ඉදිකිරීම් කටයුතු සිදු නොවන වර්ෂා කාලවලදී අවදානම වැඩි බැවින් ව්‍යාපෘති නොමැති කාලසීමාව තුළද ආරක්ෂිත සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ. | ඉදිකිරීම් අදියර | PMU හි E & S ඒකකය<br>කොන්ත්‍රාත්කරු |
| xi. **කොන්ත්‍රාත්කරු යටතේ සිටින සේවකයින්ගේ සනීපාරක්ෂක පහසුකම් භාවිතය**<br><br>කොන්ත්‍රාත්කරු යටතේ සිටින සේවකයින් සඳහා වෙනම සනීපාරක්ෂක පහසුකම් සැපයිය යුතුයි. | ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| **xii. වන සම්පතට හා වන ජීවීන්ට හානි කිරීම**<br><br>නීති විරෝධී දඩයම් කිරීම සහ සංරක්ෂිත සංරචකයන් නිස්සාරණය දැඩි ලෙස පාලනය කළ යුතුය<br><br>හිතාමතා සහ නොදැනුවත්ව වනාන්තර ප්‍රදේශයකට ගිනි තැබීම දැඩි ලෙස පාලනය කළ යුතුය | ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| **xiii. වැඩකරන කාලය**<br>ඉදිකිරීම් කටයුතු දිවා කාලයේ හෝ රාත්‍රියේ සිදු කිරීම වඩාත් සුදුසුය. | ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු<br>මාර්ග සංවර්ධන අධිකාරිය |

| | | |
|---|---|---|
| **xiv. මිනිසුන් මෙම ප්‍රදේශයට ඇතුළු වීමේ හෝ හරහා ගමන් කිරීමේ අවශ්‍යතාව**<br><br>පූර්ණ කාලීන මුරකරුවන් යෙදවීම, අනතුරු ඇඟවීමේ සලකුණු පවත්වාගෙන යාම මඟින් මෙයට ඇතුලු විය හැකි අනවසර ප්‍රවේශය වැළැක්විය යුතුය. | ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| xv. **ක්‍රමවත් ගෘහ පාලනය**<br><br>ඉදිකිරීම් අතරතුර හොඳ ගෘහ පාලනයක් පවත්වාගෙන යාම හරහා දෘශ්‍ය දූෂණය (VISUAL POLLUTION) අවම කළ යුතුය | වැඩබිම සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |
| **xvii. සේවක චර්යා ධර්ම පද්ධතිය**<br>කොන්ත්‍රාත්කරු විසින් යෝග්‍ය සේවක චර්යා ධර්ම පද්ධතියක් ඇති කිරීම මගින් වැඩබිම් සේවකයින් සහ ආසන්න ප්‍රජාව අතර ගැටුම් ඇතිවීම වැළැක්විය යුතුය. | ඉදිකිරීම් අදියර | කොන්ත්‍රාත්කරු |

### 9.7.3 වැඩබිම සඳහා වන අධීක්ෂණ අවශ්‍යතා

පහත දැක්වෙන අධීක්ෂණ සැලැස්ම ඉදිකිරීම් අදියරයේදී මෙම වැඩබිමට විශේෂිත වූ අධීක්ෂණ සැලැස්මකි. මීට අමතරව, කොන්ත්‍රාත්කරුවන්ගේ ESMP සඳහා ඇති අනනුකූලතාව දක්වා ඇති අධීක්ෂණ ක්‍රියා පටිපාටිය ඒ ආකාරයෙන්ම ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කළ යුතුය. කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ESMP ක්‍රියාපටිපාටිය ලංසු ලේඛනයේ සඳහන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ESMP සඳහා වන පිරිවැය වෙනම ගෙවුම් අයිතමයක් ලෙස දැක්වීමට අවශ්‍ය වේ. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික හා සමාජ කළමනාකරණ ක්‍රමවේද පිළිබඳ ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතු අතර PMU විසින් එය අනුමත කිරීම අවශ්‍ය වේ.

*වගුව 5: ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය*

| **අධීක්ෂණ අවශ්‍යතාව** | **පරාමිතීන්** | **අධීක්ෂණය කළ යුතු වාර ගණන** |
|---|---|---|
| i. මූලික අධීක්ෂණය | ජලයේ ගුණාත්මකභාවය | - |
| | පරිපාලන ගොඩනැගිලි සඳහා පූර්ව ඉරිතැලීම් සමීක්ෂණය | - |
| | භූමිය මත සිදුවන කම්පන | - |
| | වාතාශ්‍රයේ ගුණාත්මක භාවය: විශේෂිත සාධක | එක්වරක් * |
| | වැඩබිම් ශබ්ද මිනුම් කිරීම | එක්වරක් * |
| ii. ඉදිකිරීම් අතරතුර | ජලයේ ගුණාත්මකභාවය | - |
| | ආසන්න ගොඩනැගිල වල ඉරිතැලීම් පිළිබඳ පූර්ව සමීක්ෂණය | ඉදිකිරීම් අතර තුර සැලකිය යුතු වැඩි වීමක් සිදුවන්නේ නම් පමණක්** |
| | භූමිය මත සිදුවන කම්පන | භූ විදුම්, භූ කැණීම් හෝ කම්පන ජනනය වන අනෙකුත් කටයුතු සිදු කරන විට |
| | ඉදිකිරීම් ශබ්දය | අධික ශබ්දය නිකුත් වන අවස්ථාවලදී මාසයකට වරක් |
| | විශේෂිත අවස්ථාවලදී වාතාශ්‍රයේ ගුණාත්මක භාවය: | මාසයකට වරක් |
| iii. රථවාහනවලින් සිදු කරන විමෝචන | ක්‍රියාත්මක වන සියලුම යන්ත්‍රෝපකරණ/වාහන සඳහා අදාළ වන පරිදි විමෝචන පාලන පරීක්ෂණ සහතිකය තිබිය යුතුය-ES නිලධාරියා විසින් එය පරීක්ෂා කළ යුතුය. | |

| | |
|---|---|
| iv. අධීක්ෂණ නියෝජිතායතන | ★ ඉරිතැලීම් සමීක්ෂණ හැර අනෙකුත් සියලුම පරාමිතීන් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචිය සහිත දක්ෂ ස්වාධීන අධීක්ෂණ ආයතනයක්<br>★★ ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ සිදු කිරීම සඳහා PMU හි ලියාපදිංචි නියෝජිතායතනයක් විසින් සිදු කළ යුතුයි |
| v. වාර්තා කිරීමේ අවශ්‍යතා | **භූමියේ කම්පන තත්ත්ව** - යන්ත්‍ර සූත්‍ර භාවිතය, ඉදිකිරීම් කටයුතු සහ රථවාහන ධාවනය මගින් භූමිය මත ඇතිවන කම්පන පිළිබඳ CEA විසින් ඉදිරිපත් කර ඇති අතුරු සම්මතයන්<br>**පසුබිම් ශබ්ද මිනුම් කිරීම** - 1996 මැයි 23 දිනැති අංක 924.1 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය - CEA<br>**වායු ගුණාත්මකභාවය පිළිබඳ කරුණු** - ජාතික වායු ගුණාත්මකභාවය පිළිබඳ සම්මතයන් දැක්වෙන 2008 අගෝස්තු 15 දිනැති අංක 1562/22 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය- ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය |

## 10. මහජන සහ පාර්ශවකරුවන්ගේ උපදේශනය පවත්වා ඇති සහ/හෝ පවත්වනු ලබන මහජන උපදේශන

අවමකරණ ස්ථානය තුළ කිසිදු නිවසක් පිහිටා නොමැති බැවින් මහජන උපදේශනයේ අවශ්‍යතාවක් නොපවතී. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඇල්ල නියාමක සහකාර තරංග රුක්ෂාන් මහතා ප්‍රකාශ කළේ මෙම ව්‍යාපෘතිය මගින් ඇල්ල - වැල්ලවාය (A23) මාර්ගයේ සංචාරකයින්ගේ මෙන්ම මගීන්ගේද ආරක්ෂාවට ඉහළ සහයෝගයක් ලැබෙන බවයි. එමෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා උපරිම සහයෝගය ලබාදිය හැකි බවද ඔහු සඳහන් කළේය.

මෙම ස්ථානය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය, ඌව පළාත් කාර්යාලය- බදුල්ල, සහකාර අධ්‍යක්ෂ, එම්.කේ.ජේ.එම්.සදාත් මහතාගෙන් උපදෙස් ලබා ගත් අතර, ඔහු පවසන පරිදි, බදුල්ල දිස්ත්‍රික්කය 1996 අංක 772/22 පාංශු සංරක්ෂණ පනත යටතේ පාරිසරික සංවේදී කලාපයක් වේ. එබැවින්, ව්‍යාපෘතිය සඳහා මූලික තොරතුරු ප්‍රශ්නාවලිය (BIQ) පිළිබඳ ඇති අයදුම්පත් ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතිය ලබාගත යුතු වේ. තවද, අවම කිරීමේ කටයුතු පාංශු සංරක්ෂණය අරමුණු කර ගෙන ඇති අතර අනුමැතිය පිළිබඳ ගැටළුවක් නොමැති බව ඔහු පැවසීය.

## 11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද Covid-19 වැළැක්වීමේ පියවර

කොවිඩ් 19 වෛරස් ආසාදනය ලොව මුළුමනින්ම තුරන් කර නොමැත. එබැවින් මෙම වෛරසය ව්‍යාප්ත වීම වැළැක්වීමට/ පාලනය කිරීමට සහ යම් වෛරස් ආසාදන තත්වයක් හදුනා ගැනීමේදී කලබලයට පත්වීම වැළැක්වීමට සියළුම කොන්ත්‍රාත්කරුවන් විසින් කොවිඩ් - 19 පූර්ව සූදානම් වීමේ සැලැස්මක් සකස් කළ යුතු අතර 2021 ජනවාරි මස CIDA ආයතනය විසින් නිකුත් කරන ලද "කොවිඩ්-19 හා ඩෙංගු සඳහා වන සෞඛ්‍යය හා ප්‍රතිශක්තීකරණ වැඩිදියුණු කිරීමේ මාර්ගෝපදේශය, ඉදිකිරීම් කර්මාන්තය සඳහා වන CIDA සෞඛ්‍යය මාර්ගෝපදේශය (4වන සංශෝදනය)"

## 12. කම්කරු කළමනාකරණය

නිසි සේවක කළමනාකරණ සබඳතා පවත්වා ගනිමින් ව්‍යාපෘතියේ සේවකයින්ට සාධාරණ ලෙස සැලකීමට මෙන්ම ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා පහසුකම් සැපයීමේ වගකීම PMU සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු සතුය.

එහි ප්‍රධානතම අරමුණු වන්නේ;

- රැකියාවේ ආරක්ෂාව සහ සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම.
- ව්‍යාපෘති සේවකයින්ගේ සාධාරණ සැලකීම, වෙනස් කොට නොසැලකීම සහ සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

- කාන්තාවන්, ආබාධ සහිත පුද්ගලයින්, ළමුන් සහ සංක්‍රමණික සේවකයින්, කොන්ත්‍රාත් සේවකයින්, ප්‍රජා සේවකයින් සහ ප්‍රාථමික සැපයුම් සේවකයින් වැනි අවදානමට ලක්විය හැකි සේවකයින් ඇතුළු සියලුම ව්‍යාපෘති සේවකයින් සුදුසු පරිදි ආරක්ෂා කිරීම.
- සියලුම ආකාරයේ බලහත්කාර ශ්‍රමය සහ ළමා ශ්‍රමය භාවිතය වැළැක්වීම.
- ජාතික නීතිවලට අනුකූල වන පරිදි ව්‍යාපෘති සේවකයින්ගේ සංගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීමේ මූලධර්මවලට සහාය වීම.
- ව්‍යාපෘති සේවකයින්ට රැකියා ස්ථානයේ ගැටළු මතු කිරීමට ප්‍රවේශ විය හැකි අවස්ථා ලබා දීම.

## 13. නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනයන්හි අනුමැතිය ලබා ගැනීම

*වගුව 6: නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව එකඟතාව සහ අනුමැතිය*

| අවශ්‍යතාව/ අනුමත කිරීම/ ආයතනය | ව්‍යාපෘතියට අදාළත්වය |
|---|---|
| **13.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම** | |
| දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය | ව්‍යාපෘති යෝජනාව ප්‍රධාන අමාත්‍යවරයා සහ දිස්ත්‍රික්කයේ අනෙකුත් පාර්ශවකරුවන් සහභාගී වන දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු ය. මෙම කමිටුවේදී PMU හි නිලධාරියෙකු විසින් ව්‍යාපෘතිය පිළිබඳව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය පිළිබඳවත් එහිදී ඇතිවන පාරිසරක හා සමාජයීය ගැටලු ඇතුළු කරුණු පිළිබඳවත් සාකච්ඡා කරනු ලැබේ. මෙහිදී වැඩි අවධානයක් යොමු වන ගැටළු පිළිබඳව ESMP හිදී පැහැදිලි කරනු ලැබේ. මෙම කමිටුවේදී ගනු ලබන තීරණ සහ නිර්දේශ පිළිබඳව ESMP හිදී සලකා බලනු ලැබේ. |
| සැලසුම් කමිටුවේ අනුමැතිය | ඇල්ල ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය |
| **13.2 ව්‍යාපෘතියට අදාළ රජයේ/ඉඩම් හිමියන්ගේ අනුමැතිය** | |
| මධ්‍යම පරිසර අධිකාරිය | 1951 අංක 25 දරණ පාංශු සංරක්ෂණ පනත මගින් බදුල්ල් දිස්ත්‍රික්කය සංවේදී කලාපයක් ලෙස නම් කර ඇති බැවින් දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාව ලබා ගත යුතු ය. |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ප්‍රදේශය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වන බැවින්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වේ. එසේම, වන රක්ෂිතයන් නොමැති බැවින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය නොවේ. |
| භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය | පාෂාණ, ඛනිජ වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා ගැනීමට, ප්‍රවාහනයට සහ ඉවත් කිරීමට අනුමැතිය ලබා ගැනීම (අවශ්‍ය නම් පමණක්) |
| ඇල්ල ප්‍රාදේශීය සභාව | අපද්‍රව්‍ය සහ ශාක අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඇල්ල ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලබා ගැනේ. |
| ලංකා විදුලිබල මණ්ඩලය | විදුලි බල සැපයුම ලබා ගැනීමට ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් අනුමැතිය ලබා ගැනීම |
| **13.3 ඉඩම් හිමිකාරීත්වයෙන් කැමැත්ත / විරුද්ධත්වයක් නොමැති බව / නීත්‍යානුකූල ගිවිසුම** | |

| | |
|---|---|
| ඉඩම් හිමිකරු (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව) | ඉඩම් හිමිකරුවන් (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව) සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අධිකාරිය අතර නීත්‍යානුකූලව බැඳී ඇති ගිවිසුමක් අත්සන් කිරීම, ව්‍යුහයන් ඉවත් කිරීමට, ඉඩමට ප්‍රවේශ වීමට, ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට සහ දිගු කාලීන නඩත්තු කටයුතුවල නිරත වීමට බාධාවක් නොමැත. |

*වගුව 7: අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත (තාවකාලික) කාල රාමුව*

| **අනුමැතිය ලබා ගැනීම** | මාසය 01 | | | | මාසය 02 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සතිය 01 | සතිය 02 | සතිය 01 | සතිය 02 | සතිය 01 | සතිය 02 | සතිය 01 | සතිය 02 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**<br>***දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම***<br>ව්‍යාපෘති විස්තර භාරදීම<br>ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම<br>ගැටලු නිරාකරණය කර ගැනීම<br>අනුමැතිය | | | | | | | | |
| ***සැලසුම් කමිටුවේ අනුමැතිය***<br>ව්‍යාපෘති විස්තර භාරදීම<br>ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම<br>ගැටලු නිරාකරණය කර ගැනීම<br>අනුමැතිය | | | | | | | | |
| ***අනෙකුත් අනුමැතීන් ලබා ගැනීම***<br>GSMB<br>ආරක්ෂක අමාත්‍යාංශය (අවශ්‍යතාවය මත රඳා පවතී) | | | | | | | | |
| ***ඉඩම් හිමිකරුවන්ගේ එකඟතාවය/විරුද්ධත්වයක් නොමැති බව*** | | | | | | | | |

## 14. මෙම ව්‍යාපෘතිය සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය

*මෙම ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවිය හැකි ගැටළු සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩල පිහිටුවීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික හා සමාජයීය නිලධාරී විසින් සිදු කල යුතුය. (අභියාචනා මණ්ඩල පිහිටුවීමට අදාල නිර්දේශ පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ඊඑෆ්) යටතේ සපයා ඇත.)*

*සමාජීය සහ පාරිසරික ගැටළු සම්බන්ධ සියලුම පැමිණිලි වාචිකව/දුරකථනයෙන් හෝ ලිඛිතව පහත පුද්ගලයා/ස්ථානය වෙත එවීමට හැකිය.*

- *ව්‍යාපෘති අධ්‍යක්ෂ/ RLVMMP*
  - *දුරකතනය : +94 112 559 869*
  - *ෆැක්ස් : +94 112 502 611*
  - *විද්‍යුත් තැපෑල : pd.rlvmmp@gmail.com*
  - *වෙබ් අඩවිය : rlvmmp.lk*
- *දිස්ත්‍රික් නිළධාරී/ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) හෝ*
- *වැඩබිම් නිළධාරී/ RLVMMP*
- *මාර්ගගත අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය (**https://rlvmmo.lkgrms**)*

## 15. ව්‍යාපෘති තොරතුරු නිකුත් කිරීම

පහත දැක්වෙන ආයතන සහ සංවිධාන වෙත අවම වශයෙන් පහත වගුවෙහි දක්වා ඇති පරිදි ව්‍යාපෘතියේ ES තොරතුරු තොරතුරු නිකුත් කිරීම PMU හි වගකීම වේ.

*වගුව 8: යෝජිත තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණය*

| තොරතුරු | යෝජිත නියෝජිතායතන | තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණය |
|---|---|---|
| i. ව්‍යාපෘති සැලැස්ම (ස්ථානීය විස්තර, පිරසැලසුම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද) | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, අනෙකුත් දිස්ත්‍රික් මට්ටමේ නියෝජිතායතන, NBRO දිස්ත්‍රික් කාර්යාලය, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම් සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම, අනුමැතිය සහ එකඟතාව ලබා ගැනීම |
| ii. පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම් සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම, අනුමැතිය සහ එකඟතාව ලබා ගැනීම |
| iii. අධීක්ෂණ වාර්තා (මූලික හා ඉදිකිරීම් අතරතුර) | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, , AIIB සහ අවශ්‍යතාව පරිදි අදාළ පාර්ශව | ප්‍රගති වාර්තා, විශේෂ රැස්වීම්, ගිවිසුම් සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම |
| iv. පාරිසරික අනුකූලතාව සහ ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සඳහා ස්ථානීය පරීක්ෂාව | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, , ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී, NBRO දිස්ත්‍රික් කාර්යාලය, AIIB සහ අදාළ වෙනත් පාර්ශව | ලිඛිත හා වාචික සන්නිවේදන, අදාළ වාර්තා ලබා දීම |
| v. පාරිසරික සහ සෞඛ්‍ය කරුණු සම්බන්ධව ගනු ලැබූ තීරණ සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් | ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී, NBRO දිස්ත්‍රික් කාර්යාලය, AIIB සහ අදාළ වෙනත් පාර්ශව | රැස්වීම්, ගිවිසුම් සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම |
| vi. අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය | අදාළ පාර්ශව, AIIB | ලිඛිත හා වාචික සන්නිවේදන, අදාළ වාර්තා ලබා දීම |

## ඇමුණුම 1: හඳුනාගත් ස්ථානයේ ස්වභාවය සහ උපදේශනය දැක්වෙන ඡායාරූප





*අස්ථායී බෑවුම් ප්‍රදේශය*





*ආපදා අවමකරණ ප්‍රදේශයේ පහල බෑවුම*



*ඇල්ල රේන්ජර්හි සහකාර කලමනාකරු තරංග රුක්ෂාන් මහතාගේ සමඟ උපදේශනයේ යෙදීම*



*ඉහළ බෑවුමේ ජල මාර්ගය*

## ඇමුණුම II - ස්ථානීය අංක 76 - L2 ඇල්ල-වැල්ලවාය මාර්ගය (25/1 බෝක්කුව අසල) සංකල්පීය (යෝජිත නැරඹුම් මැදිරිය) සංවර්ධන සැලැස්ම

### නායයාම් ආපදා අවමකරණය මඟින් ප්‍රදේශයේ සංවර්ධන විභවයන් උපයෝජනය සඳහා අවස්ථාවක් කරගැනීම හැදින්වීම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) මූල්‍ය ආධාරය යටතේ නායයෑම් ආපදා අවම කරමින් නායයෑම් ඇතිවීමේ වැඩි අවධානමක් ඇති ස්ථානවල අස්ථායී බාවුම් නිවැරදි කරනු ලබයි. මෙහිදී ප්‍රධාන වශයෙන්ම දුම්රිය මාර්ග, මහා මාර්ග හා ප්‍රජාවන් ආශ්‍රිත යටිතල පහසුකම් හා සම්බන්ධ නායයෑම් අවදානම අවම කිරීම බලාපොරොත්තු වේ. ඒ අනුව, දිවයිනේ පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක් ආවරණය වන පරිදි ස්ථාන 147ක නායයෑම් ආපදා අවම කිරීම මෙමෙ ව්‍යාපෘතිය මඟින් සිදුකෙරේ.

පාරිසරික හා සමාජීයය සැකස්ම සහ සෞඛ්‍ය හා ආරක්ෂණ තත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයෙන් වෙනස් වන බව මූලික අධීක්ෂණයන් හීදී අනාවරණය විය.එහෙයින් පාරිසරික හා සමාජයීය කළමනාකරණ තක්සේරු වාර්තා අනුව එක් එක් නායයෑම් ස්ථානයට විශේෂිත පාරිසරික හා සමාජයීය ඇගයීම සකස් කර ඇත. මෙමඟින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සමඟ ප්‍රදේශයේ සංවර්ධන විභවයන් උපයෝගී කරගැනීම, සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම හෝ නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු නොකරන බව පෙනී ගොස් ඇත.එවැනි හඳුනාගත් සංවර්ධන විභවයන් වශයෙන් වෙළඳපල පහසුකම් සඳහා අවකාශ සැපයීම, සේවා මධ්‍යස්ථාන හෝ විනෝදාත්මක පහසුකම් ඇති කිරීම සහ ප්‍රදේශයේ ජනතාවට සමාජ ආර්තික ක්‍රියාකාරකම් සඳහා අවස්ථා ඇති කිරීම තුලින් නගර ව්‍යාප්තිය වැනි දෑ හඳුනාගත හැකිය.

ඇල්ල-වැල්ලවාය (A23) මාර්ගයේ ආපදා අවම කිරීම් ස්ථාන 3 ක් හඳුනාගෙන ඇති අතර ඇල්ල ස්ථානීය අංක 76 - L2 එම ස්ථානවලින් එකකි. ක්ෂේත්‍ර චාරිකා තුළින් සිදුකරන ලද ස්ථානීය විමර්ශන සහ මහජන උපදේශනය හරහා මෙම ප්‍රදේශයේ පවතින සංවර්ධන විභවතාවන් හඳුනා ගන්නා ලද අතර එම විභවතාවන් උපයෝජනය කරමින් නායයෑම් අවදානම අවම කිරීමට සමගාමීව සමාජයට වැඩි සමාජ ආර්ථික ප්‍රතිලාභ ලබා දීමේ අරමුණින් ඇල්ල ස්ථානීය අංක 76 - L2 සංවර්ධන සැලැස්ම කෙටුම්පත් කර ඇත.

### ඇල්ල - වැල්ලවාය මාර්ගයේ (25/1 බෝක්කුව අසල) නායයෑම් අවම කිරීම

ශ්‍රේණිය මුදුනේ ඇති ප්‍රවේශ මාර්ගය හරහා දිවෙන ජලාපවහන පද්ධතිය, බෑවුම් අසාර්ථක වීමට ප්‍රධාන හේතුවයි. ඉහළ බෑවුමේ ජලාපවහන මාර්ගයක් ඉදි නොකළහොත් සිරස් බෑවුම හරහා විශාල ජල කදක් සෘජුවම ගලා යන අතර වැසි ජලය බැසයාමට නිසි කාණු පද්ධතියක් නොතිබීම නිසා ගලායන ජල මාර්ගය මධ්‍යයේ ජල පීඩනය වැඩි විය හැක.ඇල්ල - වැල්ලවාය ප්‍රධාන මාර්ගය ඉදිකිරීමේදී බෑවුම් වෙනස් කිරීම් සඳහා ඉංජිනේරු බෑවුම් ස්ථායීතා සම්මතයන් අනුගමනය කර නොමැති වීම හා දුර්වල ජලාපවහන පද්ධතිය එයට හේතුවයි. 2020 වර්ෂයේදී, බෑවුම හරහා පාලනයකින් තොරව වැසි ජලය ගලායාම හේතුවෙන් පසෙහි ඉහළ ස්ථරයේ විස්ථාපනයක් සිදු වී ඇත. බාදනය වීමෙන් අවසාදනය වන ලද පාංශු හා පාෂාණ කොටස් මෙම අස්ථායී බෑවුමේ විරුද්ධ පැත්තේ තැන්පත්වී ඇති ආකාරය ක්ෂේත්‍ර චාරිකාවේදී නිරීක්ෂණය කළ හැකි විය.



*රූප සටහන් අංක 1- ආපදා අවමකරණ ස්ථාන 77*

පහත සඳහන් නායයෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග මෙම ස්ථානයේ සිදුකිරීමට යෝජිතය.

- මතුපිට ජලාපවහන පද්ධතිය ඉදිකිරීම.

- සුන්බුන් තැන්පත්වීමට රැඳවුම් බැම්ම ඉදිකිරීම.

- නැවත හැඩගැන්වීම.

- ගල් වැටීම වැළැක්වීම සඳහා දැලක් එලීම.

## ඇල්ල-වැල්ලවාය මාර්ගය (25/1 බෝක්කුව අසල)- යෝජිත බහු මට්ටමේ නැරඹුම් මැදිරිය

## සංවර්ධන විභවතාවයන්

ඇල්ල ශ්‍රී ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රේණිගත කර ඇති අතර එය රාවණා කන්ද සහ කුඩා ආදම්ගේ කඳු මුදුන් වලින් වටවී ඇත. ඇල්ල සංචාරක තොරතුරු මධ්‍යස්ථානයට (TIC) අනුව හල්පේවත්ත තේ කම්හල, ඇල්ල පර්වතය, ආරුක්කු නවය, සිප්ලයින්, රාවණා දියඇල්ල, කුඩා රාවණා දියඇලි, කිතුල් ඇල්ල, දෙමෝදර ලූප්, ඇල්ල කුළුබඩු උයන, ලංකා තේ කම්හල ආදී සංචාරක ගමනාන්ත 12ක් හඳුනාගෙන ඇති නමුත් ඇල්ල අවට සංචාරක ස්ථාන 12 කට වඩා වැඩි ප්‍රමාණයක් පවතී.

සංචාරකයින් සහ ප්‍රදේශවාසීන් භාවිතා කරන ප්‍රමුඛ ප්‍රවේශ මාර්ග දෙකක් මේ හරහා ගමන් කරන අතර සංචාරකයින්ට ඇල්ලට ළඟාවීමට පවතින ජනප්‍රියතම ප්‍රවාහන මාධ්‍ය වන්නේ කොළඹ සිට ඇල්ල හරහා බදුල්ලට ගමන් කරන දුම් රියයි. ඒ අතරම, සාමාන්‍යයෙන් දිනකට වාහන 3602 ක් ඇල්ල - වැල්ලවාය මාර්ගය (A23) හරහා ඇල්ලට ඇතුළු වන අතර යෝජිත අවම කිරීමේ ස්ථානය ඇල්ල - වැල්ලවාය මාර්ගයට (A23) යාබදව පිහිටා ඇත.

වාර්ෂිකව මෙරටට පැමිණෙන මුළු සංචාරකයින්ගෙන් 6%ක් ඇල්ල නගරයට පැමිණෙන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් නිකුත් කරන ලද තොරතුරු අධ්‍යයනය කිරීමෙන් පසු නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇත. මෙසේ පැමිණෙන සංචාරකයන්ගේ මූලාශ්‍ර රටවල් ලෙස ප්‍රංශය, ජර්මනිය සහ ඇමරිකාව මෙන්ම චීනය, ඉන්දියාව සහ ඕස්ට්‍රේලියාව වැනි ආසියානු රටවල් ද නව ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. සංචාරකයින්ගෙන් 28% ක් කඳු නැගීම සහ කඳුවුරු බැඳීම අත්විඳීමටත්, 17% ක් ග්‍රාමීය ජීවිතය අත්විඳීමටත්, 24% ක් පිරිසිදු වාතය විඳ ගැනීමටත්, 30% ක් ස්වභාවික පාරිසරික සුන්දරත්වය අත්විඳීමටත් පැමිණෙන බව අධ්‍යයනවලින් හෙළි වී තිබේ. සංචාරකයින් බහුතරයක් ඇල්ලට පැමිණෙන්නේ නගරයේ සහ ඒ අවට පවතින ස්වභාවික පාරිසරික සුන්දරත්වය විඳගැනීමට බව මෙයින් හෙළි වේ.එබැවින් මෙම ප්‍රදේශය සංචාරක මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමත් සමඟම නායයෑමේ අවදානම අවම කිරීම සමාජයට මෙන්ම දෙස් විදෙස් සංචාරකයින්ට ද වැඩි සමාජ ආර්ථික ප්‍රතිලාභයක් ලබා දෙනු ඇත.

එබැවින් මෙම ප්‍රදේශය සංචාරක මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමත් සමඟම නායයෑමේ අවදානම අවම කිරීම තුළින් සමාජයට මෙන්ම දෙස් විදෙස් සංචාරකයින්ට ද වැඩි සමාජ ආර්ථික ප්‍රතිලාභ සැලසෙනු ඇත.

## සංවර්ධන අවශ්‍යතා

ස්ථානීය විශ්ලේෂණ, මහජන සහ ආයතනික උපදේශන මගින් පහත සංවර්ධන අවශ්‍යතා හඳුනා ගන්නා ලදී.

- ඇල්ල, රාවණා කන්ද සහ කුඩා ආදම්ගේ කඳු මුදුනෙන් වට වූ ස්වභාවික උස් භූ දර්ශනයකින් සමන්විත වන අතර සංචාරකයින් දර්ශනීය සුන්දරත්වය භුක්ති විඳීමට ඇල්ල-වැල්ලවාය (A23) මාර්ගය භාවිතා කරයි. නමුත් මෙම මාර්ගයේ පවතින්නේ ඉතා සීමිත සංඛ්‍යාවක දර්ශන තල ගණනාවකි.
- නායයෑම් අවම කිරීමේ ස්ථාන 3ක් NBRO විසින් හඳුනාගෙන ඇති අතර, ඇල්ල - වැල්ලවාය (A23) මාර්ගයේ තවත් කුඩා පරිමාණයේ නායයෑම් කිහිපයක් ක්ෂේත්‍ර චාරිකාවේදී නිරීක්ෂණය කළ හැකි විය. නායයෑම් හරහා සංචාරකයින්ට සහ ඇල්ල - වැල්ලවාය (A23) මාර්ගය භාවිතා කරන්නන්ට ඕනෑම වේලාවක අනපේක්ෂිත ව්‍යසනයක් විය හැක.
- ඇල්ල ප්‍රදේශයේ පවතින සංවර්ධන පීඩනයත් සමඟ හෝටල් හිමියන් මාර්ගය දෙපස පිහිටි ඉඩම් අත්පත් කර ගැනීමට උත්සාහ කරයි. මෙය මෙම ප්‍රදේශයේ ස්වභාවික පරිසරයේ වඩාත් සංවේදී මනරම් දර්ශන නැරඹීමට බාධාවක් විය හැකිය.
- අවට ජනතාවගේ ප්‍රකාශවලට අනුව, ඇල්ල - වැල්ලවාය මාර්ගයේ වාහන රැසක් දැකගත හැකි වූ අතර, නිසි වාහන නැවැත්වීමට ඉඩකඩ නොමැතිකම හේතුවෙන්, සංචාරක වාහන ප්‍රධාන මාර්ගය දෙපස නවතා තැබීම නිසා ප්‍රදේශයේ මාර්ග තදබදයක් ඇති කරයි.

**යෝජිත ව්‍යාපෘති ක්‍රියා**

ප්‍රදේශයේ සංවර්ධන විභවයන් අවබෝධ කර ගැනීමෙන්, යෝජිත සංවර්ධනය ප්‍රධාන වශයෙන් පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කරයි;

**බහු මට්ටමේ නැරඹුම් මැදිරිය** - යෝජිත බහු මට්ටමේ නැරඹුම් මැදිරිය ඇල්ල කඳු පන්තියේ දර්ශනීය සුන්දරත්වය භුක්ති විඳීමට අවස්ථාව ලබා දෙයි.

- බහු මට්ටමේ තට්ටු බහු ක්‍රියාකාරීත්වයක් සපයයි. උදාහරණයක් ලෙස: බිම් මට්ටමේ තට්ටුවක් ළමා ක්‍රීඩා පිටියක් ලෙස භාවිතා හැකි අතර ඉහළ මට්ටමේ තට්ටුවක් හිරු එළිය සඳහා භාවිතා කළ හැකිය.

- විශිෂ්ට දසුනක් භුක්ති විඳිමට හැකිවීම: එය ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වා අලංකාර හිරු බැස යෑමක් හෝ පරිදර්ශක අහසක් නිරීක්ෂණය කළ හැක. එළිමහනේ හමා එන සුළඟ එම දර්ශනය රසවිඳීමට මනා පිටුවහලක් වෙයි. එසේම, එය ස්වභාවික භූ දර්ශනය සමඟ වඩාත් හොඳින් මුසු වීමට උපකාරී වේ.

**වාහන නැවැත්වීමේ ප්‍රදේශය** - සංචාරක නැවතුම්,වාහන කුලියට ගැනීම සහ දේශීය සංචාරකයින් සඳහා වාහන නැවැත්වීමේ ස්ථාන සඳහා පටු තීරුව යෝජනා කර ඇත.

**ඉහත යෝජනාව ක්‍රියාත්මක කිරීමට පෙර සලකා බැලිය යුතු වැදගත් අංග**

- **භූ තාක්‍ෂණික අංශය** - අවම කිරීමේ ස්ථානය දැඩි බෑවුම් සහිත ප්‍රදේශයක පිහිටා ඇති බැවින් යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර, හැකිතාක් දුරට ස්වභාවික ලක්‍ෂණ/වෘක්ෂලතා/ශාක රඳවා තබා ගනිමින් නිසි සහ සුදුසු අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. පවතින ගස් සම්පූර්ණයෙන්ම ඉවත් කරනවාට වඩා, හැකි සෑම විටම ස්වභාවික වෘක්ෂලතා රඳවා තබා ගැනීමට කටයුතු කළ යුතුය.
- **දෘශ්‍ය නිර්මාණ අංශය** - බහු මට්ටමේ නැරඹුම් මැදිරිය උපායමාර්ගිකව ස්ථානගත කිරීම හරහා දර්ශන තලය ප්‍රශස්ත කළ හැකි අතර රඳවා තැබීමේ ව්‍යුහයන් ස්ථානීය වාස්තුවිද්‍යාත්මක ස්වභාවය සහ ස්වභාවික පරිසරය සමඟ හොඳින් ඒකාබද්ධ විය යුතුය. එසේම දර්ශනීය ස්වභාවික ලක්ෂණ නිර්මාණයට ඇතුළත් කළ යුතුය.
- **සැලසුම් අංගය**: බෑවුම් සහිත ස්ථාන සමඟ ප්‍රධාන සැලසුම් සලකා බැලීම සඳහා නැරඹුම් මැදිරියේ රාමුවට ආධාරකයක් වශයෙන් භාවිතා කරන කණුවල ස්ථිර පදනමක් ඇති බවට තහවුරු කරගත යුතුයි.දිරාපත්වීම වැළැක්වීමට,අධික බර පැටවීමට සහ දිගු ආයු කාලයක් ලබා දීමට නිවැරදි නිවැරදි ශක්තිය ශ්‍රේණිය සහිත දැව වැනි පරිසර හිතකාමී ද්‍රව්‍ය වලින් ඒවා සෑදිය යුතුය.
- **පාරිසරික අංශය** - මෙම ස්ථානය වනජීවී සංරක්ෂණ ප්‍රදේශයට අයත් වන බැවින් සංවර්ධනය, ස්වභාවික වෘක්ෂලතා සහ භූමි ආකෘති වැනි ස්වභාවික පාරිසරික ලක්ෂණ වලින් ප්‍රයෝජනය ගනී.




*රූපසටහන් අංක 2 - ස්ථානීය අංක 7හි හරස් පැතිකඩ*

**අපේක්ෂිත ව්‍යාපෘතියේ නියැදි රූපය**



*බහු මට්ටමේ නැරඹුම් මැදිරිය සැලසුම් නියැදිය*



*වේදිකාවේ සිට දර්ශනය*